

# සංවාස දීපනිය

# සංවාස දීපනිය.

බුරුම රට විසුද්ධාරාමික,

මහා නායක ස්ථවිර

ස්වාමිපාදොත්තමයාණන් වහන්සේ

විසින් රචිතය.

ලක්දිව මාලිගාවත්තේ,

විසුද්ධාරාමවාසී,

**සිරිධම්මම ස්වාමින් වහන්සේ**

විසින් සිංහල භාෂාවට නගා පිටපත්

කරන ලදී.

බු.ව. **2458**

ක්‍රි.ව. **1915**

# විඥාපනය.

"**සංවාස දීපනිය**" නම්වූ මේ ග්‍රන්ථය වනාහි ධර්‍මාර්‍ථ දේශනා ප්‍රතිවෙධ සඞ්ඛ්‍යාත චතුර්විධ ගාම්භීර්‍ය්‍යයෙන් මහා සාගරයසේ ගැඹුරුවූ සර්‍වඥ ශාසනයෙහි සැදැහැයෙන් පැවිදිවූ කුලදරුවන් විසින් අවශ්‍යයෙන් දතමනා විනය විනිශ්චයකි, ඒ මේ විනයවිනිශ්චය කවර රටෙක කවරනාම් උතුමෙකුවිසින් රචනාකරණලද්දේදයත්? ලක්දිව සහ සියම් බුරුම ආදී රටවලත් ලජ්ජී සුපෙසල ශික්ෂාකාමී භාවයෙන් ඉරසඳසේ ප්‍රසිද්ධවූ පර්‍ය්‍යාප්ති ශාසන ශ්‍රී භාරධාරී "**ජාගරාභි කම්බජ සද්ධම්ම වංශ සිද්ධපවරධම්ම සෙනාපති මහාධම්ම රාජාධිරාජගුරු**" යන රාජදත්ත නාමමාපලක්ෂිත ජාගර මහා ස්ථවිර ස්වාමීන්ද්‍රයන්වහන්සේගේ දකුණත වැනි **සබ්බිභාගික** ශිෂ්‍යරත්නයක්වූද, තදාචාර්‍ය්‍යවාදයෙහි ඉමානවම නික්මීම ඇති හෙයින් **සොවචස්සතාගුණයෙන්** යුක්තවූද, ස්වකීය ජීවිතයසේ මොනවට රක්ෂාකරණලද සතරසංවර සිල් ඇති හෙයින් **සීල්වන්ත ගුණයෙන්** යුක්තවූද, විෂ්කම්භන සමුච්ඡෙද වශයෙන් ක්ලේශය ප්‍රහීණ නොකලේ වීනමුදු කලකින්වත් ක්ලේශයෙන් දූෂිත භාවයක් දක්නට නැතිහෙයින් **ධනාභි සොරච්චතාගුණයෙන්** මොනවට යුක්තවූද, කුලගෙධ ඥාතිගෙධ ප්‍රත්‍යය ගෙධයන්ගෙන් දුරින්ම දුරුවූද, ලද ලද දෑහැම්පසයන් සුදුසු පරිද්දෙන් ලොකුකුඩා ශිෂ්‍ය සමූහයාහට බෙදදෙන සුළුවූ හෙයින් **සංවිභාගගුණයෙන්** යුක්තවූද, මෙත් කුළුණු පෙරදැරිව දහස්ගණන් ශිෂ්‍ය සමූහයාට කරණලද අවවාදනුශාසනා ඇතිහෙයින් **සංග්‍රහ**

**ක්ෂමාගුණයෙන්** යුක්තවූද, කාමාදීනවයෙන් අතිශය දරිද්‍රභාවප්‍රාප්ත භවසම්පත්තිය මහත් භයක් වශයෙන් දක්නාහෙයින් **සංසාරභය භීරුකවූද**, විනයාභිධර්ම සූත්‍ර සඞ්ඛ්‍යාත පිටකත්‍රය පිළිබඳව නානා විශාල ග්‍රන්ථ රාශියක් කරවදළ හෙයින් **මහාග්‍රන්ථකාරකත්වයට පැමිණ වදළාවූද**, මෙකී නොකී ගුණ ගණාඞ්ගයන්ගෙන් සජ්ජිතවූ හෙයින්ම රාජරාජාමාත්‍යාදීන් විසින් පූජනීය භාවයට **පැමිණි** ශිලාලේඛණාරෝපණ සඞ්ඛ්‍යාත පස්වැනි මහාසඞ්ගායනාව කරවූ "**මෙංඩුං**" මහ රජතුමන්ගෙන් "**විසුද්ධාචාර කවිධජ මහාධම්ම රාජගුරු**"යයිද, රතනාමණි චෛත්‍යකාරවූ "තිබෝ" මහරජතුමන්ගෙන් "**විසුද්ධාචාර කවි ධජාධිපති සිරිපවර මහාධම්ම රාජාධිරාජගුරු**" යයිද ලබනලද උපාධිනාමමයකින් උපලක්ෂිත වූද,

**"සීලෝ ච ගරු භාවනීයෝ--වත්තා ච වචනක්ඛමෝ**
**ගම්භීරඤ්ච කථං කත්තා--නො චට්ඨානෙ නියෝජයෙ"** යි

වදළ පරිද්දෙන් අවවාදානුශාසනා කතිකාවත් පැණවීම් ආදියෙන් "**ශ්වේජින්**" වංශික සංඝයාවහන්සේ යථාස්ථානයෙහි යොදවන්නාවූද, **මෙංඩුං මහරජතුමන්ගේ** අග්‍රමහෙසිකාවූ "**සෙතිබසාමිණී**" නම් රාජදේවිය විසින් **ලක්ෂ ගණන්** ධනවිසඳකරවා පුදනලද බුරුමරට රතනාපූර්ණරාජධානියෙහි පෙරදිගින් පිහිටි "**මහා විසුද්ධාරාමයෙහි**" සහ අපරදිගින් පිහිටි "මහා විසුද්ධාරාම"යෙහිත් කලින්කල වැඩවෙසෙමින් ශාසනාවට සුසුත් වැඩකර වදාරන්නාවූ විසුද්ධාරාමික **මහා නායක ස්ථවිර ස්වාමි**

**පාදනායකයාණන්වහන්සේ** විසින් අලජ්ජී [illegible] සාමීකර්ම සංවාසයන් පිළිබඳව මෙකල [illegible] සැදැහැවතුන්.තුළ ඇතිවී තිබෙන සැක දුරලීම පිණිස පෙළ අටුවා දෙක හා සසඳ බුරුම භාෂාවෙන් කරණලද්දකි, එය කොළඹ මාලිගාවත්තේ විසුද්ධාරාමාධිවාසී "**ආචාර්ය සිරිධම්ම ස්වාමීපාදයන්වහන්සේ**" විසින් ස්වකීය ධර්මාන්තේවාසී මාතර "**දේවානන්ද ස්වාමීන්වහන්සේ**" ගේ ආරාධනාවෙන් ලඞ්කාවිපවාසී සැදැහැවතුන්ගේ ප්‍රයෝජනය පිණිස සිංහල භාෂාවට පෙරළා සංස්කරනලදී. බුද්ධශාසන මහාසුරසේනාපති **ඇම්. ධර්මරත්නාභිධාන** ලක්මිණිපහන් කතුතුමාණන් විසින්ද, බම්බලපිටියේ ධර්මශාලාධිවාසී **ගෞරවනීය පැළෑණේ වජිරඥාණ ස්ථවිරපාදයන්වහන්සේ** විසින්ද, මැනවැයි පිළිගන්නාලදී. එහෙයින් සියළු භවතුන් විසින්ම මැදහත් සිතින් මෙය කෙළවරදක්වා කියවා බැලීමෙන් ප්‍රයෝජන ගතයුතුබව දන්නුම්දෙමි.

මෙවගට--ශාසනාස්ථිතිකාමිවූ,

**ඇස්. ඩබ්ලිව්. නලෙඅරිස් වම්හ.**

ශ්‍රී බුද්ධ වර්ෂ 2458 ජෙෂ්ඨනාම
මස පොහෝණිමි තිථියලත්
සිව්දිනා දිය.

# සංවාස දීපනිය.

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

සංවාසෙ කුක්කුච්චායන්තා
අසක්කොන්තාපි වජ්ජිතුං
අවිසයෙ විහඤ්ඤන්ති
සික්ඛාකාමාපි භික්ඛවො.

තස්මා සුඛාය ලජ්ජීනං
එසං සංවාස දීපනිං
සංසන්දිත්වාන පාළ්‍යත්ථං
කස්සං පඨාය මූලතො.

සංවාසෙ, (අරිට්ඨසික්ඛාපදයෙහි වදාළ සම්භොගයෙන් අතික්කම්මවූ) කර්‍මාකර්‍ම සංවාසයෙහි; කුක්කුච්චායන්තා, (අලජ්ජීන් සමග කරණ ධර්‍ම සම්භොගයෙහි එම සංවාසය ඇතුළත්කොට විමතිවිනොදනී ටීකාචාය්‍යීයන් විසින් වර්‍ණනාකළහෙයින් උපොසථාගාරයට අලජ්ජී මහණුන් ඇතුල්ව පාමොක් ඇසීම් ගාම්සුඛියකොට සීමාබැඳීම්ආදියෙහි) කුකුස් කරම්නුත්; අවිසයෙ, අවිසයානන්හි; වජ්ජිතුං. අත්පසින් දුරුවන්නටද; අසක්කොන්තා, නොහැකිවූ; සික්ඛාකාමාපි, ශික්ෂාකාමිවූද; භික්ඛවො, සුපෙසල භික්ෂූහු; අවිසයෙ ("අනාපත්තිං ආපත්තීති දීපෙති" යනාදී භෙදකර වස්තුවලට අසුවීමෙන්

අට්ඨයෙහි; විභඞ්ගට්ඨකථාහි, සම්මොහවිනො දනී-නාමා, එහෙයින්; ලජ්ජීනං, සුපෙසලසික්ඛා කාමී ලජ්ජී .භික්ෂූන්ගේ; සුඛාය, කායචිත්ත සැපය පිණිස; පාලනත්ථං, පෙලඅටුවාදෙක; සංසන්දිත්වාන, සසඳා (දෙපත් ගලපා); ඛෙපං, සංක්ෂෙපවූ; සංවාස දීපනිං, සංවාසදීපනී නම් ග්‍රන්ථයක්; මූලභාසාය, මූලභූත කර්ම සප්තකයෙහි පටන්; කස්සං, කරන් නෙමි--මෙහි භාවය නම් සංවාසාදි ලඝුස්ථාන ගරු ස්ථාන වශයෙන්ද අදින්නාදානාදි ගරුස්ථාන ලඝු ස්ථාන වශයෙන්ද "අනාපත්තිං ආපත්තීති දීපෙති ගරුකාපත්තිං ලහුකාපත්තීති දීපෙති" යනාදී අර්ථා රය භෙදකර ධර්ම විස්තරකොට ගෙන විමතිවිනො දනී ටීකාචාර්යයන් විසින් වර්ණනාකළ හෙයින් සසුන්වත් පැවිද්දන් අතර නොයෙක්ලෙස විවාද ඇතිවීමෙන් නොයෙක් ඇණුම්බැණුම් කුලමලකිසා ගැණීම් සහ ඊර්ෂ්‍යා ක්‍රෝධ උපනාහාදි කෙලෙශයන් උත්පාදනාවීමෙන් අපාගතවන්නෝ ඉතාබොහෝය සවර්ණ කර්ෂාපණයක් පස්මස්සකැයි එම විමති ටීකා චාර්යයන් විසින්ම විනිශ්චය කළහෙයින් රත්මිල ගණන්බලා රුපියල් (5-00 10-00 20-00) වටිනා තරම් බඩුවක් පැහැරගැන්මෙන්ම පරිජිවේ. වටිනා කමින් ඊටඅඩුවූ බඩුවක් නම් පරිජියට පමණ නොවේයයි ගෙණ සොරකම්කොට පරිජිවන්නෝද ඉතා බොහෝය —

හෙමංරජත තම්බානි-සමෙට නිදිඞ්ඪ ලක්ඛණං
අගාපෙත්වා කතො වීස-මාසකානීල කහාපණො.

හෙමපාදං සඤ්ඤුපාදං-තම්බපාදචයංහි සො
මිගෙස්සත්වාරූපමපෙස්සත්වා-කාතුංසමෙට්සුදස්සිතො.

එලානි වුච්චතෙ ගෙදසො-අනෙලකා තමෙට්රිනො
තස්සපාදො සුවණ්ණස්ස-වීස වීහගඝනො මතො.

(විනය විනිශ්චය ටීකා.)

සත්ථෙ, ශිල්පශාස්ත්‍රයෙහි; නිද්දිට්ඨ ලක්ඛණං, දක්වනලද ලක්ෂණය; අහාපෙත්වා, නොපිරිහෙළා; හෙම රජත තම්බානි, රන් රිදී තඹ යන මෙයින්; කතො, කරණලද්දවූ; වීසමාසො, මසු විස්සක්; නීල කහාපණො, නීල කාර්ෂාපණය නම්වේ. ("නී" යනු ප්‍රකාරද්‍යොතකයි.) සො, ඒ නීලකාර්ෂාපණය; හෙමපාදං, රන් පාදයක්ද (කහවනු සතරින් එකක්ද) සජ්ඣුපාදං, රිදී පාදයක්ද; තම්බපාදවයං, තඹ පාදමයක්ද; මිස්සෙත්වා, මිශ්‍රකොට; රූපංවා, නරරූපාදි යම්කිසි රූපසටහනක්; අප්පෙත්වා, කැට යම්කොට; කාතුං, කරන්ට; සමත්ථෙසු, ශාස්ත්‍රයෙහි; දස්සිතො, දක්වනලද්දේය--දොසො, දොෂය; එළාති වුච්චතෙ, එළායයි කියනුලැබේ; අනෙළකො, දොස් රහිතවූ හෙයින්; තථා, එසේ; ("නෙල"යයිකියා) ඊරිතො, කියනලද්දේය; තස්ස, ඒ නෙල කාර්ෂාපණයාගේ; පාදො, පාදයයි කියනලද පස්මසුවක්; සුවණ්ණස්ස, සවර්ණියාගේ; වීසවිභාගස්සතො, විසිවියටක් පමණ අගනේයයි; මතො, දන්නාලදි—මේ ක්‍රමයට නම් වටිනාකමින් තඹක්ස සවර්ණිය හා සමාන සවර්ණිජාතියක්වූ නෙල කාර්ෂාපණයාගේ සතරෙන් කොටසක්වූ පාදයයි කියනලද පස්මසුව රන් ගණන බර විස්සෙ කාලයක් නම් රිදිමිල පණම් හයක්පමණ පාරාජිකා, වස්තු වියහැකිබව පෙණේ. පෙල අටුවා දෙක්හිම රන්මිලයයි කියා හෝ රිදීමිලයයි කියා හෝ වෙනයක් නොපෙණේ. බිම්බිසාර රජුගේ අධිකරණ නායක ඇමතියෙක් පැවිදිවසිටිය බැවින් ඔහුගෙන් විචාරා ශික්ෂාපදය පැණවිය. දුර්භික්ෂ කාලයෙහි තල මිටක් සොරකම්කල පමණින් දව පාරාජිකාවනබව ලොවුතුරාබුදුන් විසින්ම විනිශ්චය කරණලද හෙයින් රිදීමිල පණම් ගනර

පාදයක්වී තිබුණොත් පාරාජිකාවූ ඇත්තෝ ඉතා බොහෝ වියහැකිය. මෙම්ආදී වශයෙන් ගරු ස්ථාන ලඝුකොටද කරුණක්කොට නොසැලකිය යුතුවූ සංඝයා ගැණීම් පිරිත්කීම් ආදිය අලජ්ජීන් සමග නොකටයුතුය යනාදී වශයෙන් ලඝුස්ථාන ගරු කොටද ගෙන විමති ටීකාචාර්‍ය්‍යයන් විසින් විනිශ්චයකළ හෙයින් සසුන්වන් කුලදරුවන් අතර අතිශයින් භයානක වාදවිවාද ඇතිවී තිබේ.

එහෙයින් "අභිනයං විනයොනි දීපෙති" යනාදී භේදකර වස්තුවලටබැස නොගැණීම්පිණිස සංවාස දීපනී නම්වූ ග්‍රන්ථයක් රචනා කරන්නෙම් යනු අභිප්‍රායයි.

"තජ්ජනීය නියස්ස පබ්බාජනීය පටිසාරණීය අදස්සනෙ අප්පටිකම්මෙ අප්පටිනිස්සග්ගෙ උක්ඛෙපනීය" යන සප්තවිධ කර්මයන් අතුරෙහි "යස්ස පන භණ්ඩනකාරකාදීසු අඤ්ඤතරං අඞ්ගං අත්ථි තස්ස ආකඞ්ඛමානො සංඝො යථානුඤ්ඤාතෙසු අඞ්ගෙසු කම්මෙසු ච යෙනකෙනචි අඞ්ගෙන යං කිඤ්චි කම්මං වවත්ථපෙත්වා තං භික්ඛුං කම්මාරහං කත්වා කම්මං කරෙය්‍ය" (චුල්ලවග්ගට්ඨකථා) යස්ස පන, යම් භික්ෂුවක්හට වනාහි; භණ්ඩනකාරාදීසු, භණ්ඩනකාරාදීන් අතුරෙහි; අඤ්ඤතරං අඞ්ගං, එක්තරා අඞ්ගයක්; අත්ථි, ඇත්තේ නම්; තස්ස, ඒ භික්ෂුහට; ආකඞ්ඛමානො, කැමැත්තේ නම්; සංඝො, සංඝතෙම; යථානුඤ්ඤාතෙසු අඞ්ගෙසුච, යථානුඥාත අඞ්ගයන් අතුරෙන්ද; කම්මෙසුච, කර්මයන් අතුරෙන්ද; යෙනකෙනචි අඞ්ගෙන, යම්කිසි අඞ්ගයකින්; යංකිඤ්චිකම්මං, යම්කිසි කර්මයක්; වවත්ථපෙත්වා, ව්‍යවස්ථාකොටගෙණ; තං භික්ඛුං, ඒ භික්ෂුව; කම්මාරහංකත්වා, කර්මාර්හකොට; කම්මං, කර්මය; කරෙය්‍ය, කරන්නේය—යනු කීහෙයින්

භණ්ඩනකාරකතාදි අඞ්ගයකින් සාපත්තිකකර්මහි භාවයපිණිසවැරදිකළමහණ ඇවතට නංවා සංඝතෙ මේ ඉදින් කැමැත්තේ නම් කැමැති කර්මයක් කරන්නේ ය. ගෘහස්ථයන් සම්බන්ධ ගෘහස්ථ ප්‍රතිසංයුක්ත ධාර්මිකපටිස්සවයවරදවාලීමෙන් දුකුලා ඇවතටපත්ව වාසයකරණ භික්ෂුවට අඩයොදුන්තුළ වාසයකරණ භික්ෂූන් විසින් තුන්යලදක්වා ගොස් ඔවාද කථා චොදනා සාරණාකළතමුත් ඒ තමා අවන් ඇවත නොදක පිළිසම් නොකොට වෙසේ නම් ඒ භික්ෂුව හට තර්ජනය වශයෙන් තජ්ජනීය කර්මයද පිරිස්හැර හිඳීම පිණිස නියස්සකර්මයද ඒ ගමින් ඒ ආරාමයෙන් නික්මයාම පිණිස පබ්බාජනීය කර්මයද දායකයාකරා ගොස් පැමිණි වරද කියා කමාකරවා ගැනීම පිණිස පටිසාරණීයකර්මයද ප්‍රකෘති භික්ෂූන් සමග සම්භොග සංවාස සහශෙය්‍ය නොකිරීමපිණිස උක්ඛෙපනීය කර්මයද කටයුත්තේය. වාදසම සංඝාදිසෙසයෙහි වදාළ පරිද්දෙන් සමනුභාසන කර්මය හෝ කටයුත්තේය.

“යෙ පස්සන්ති යෙ සුණන්ති තෙහි වත්තබ්බො සුත්වා න වදන්ති ආපත්ති දුක්කටස්ස.” යෙ, යම් භික්ෂුකෙනෙක්; පස්සන්ති, දකිද්ද; යෙ, යම් භික්ෂුකෙනෙක්; සුණන්ති, අසද්ද; තෙහි; ඒ දුටු ඇසූ භික්ෂූන් විසින්; වත්තබ්බො, අනුශාසනා කටයුතු වෙයි; සුත්වා, අසා; නවදන්ති, අනුශාසනා නොකෙරෙත් නම්; දුක්කටස්ස, දුකුලා ඇවතට; ආපත්ති හොති, පැමිණීමවේ--මෙසේවදාළහෙයින් යම්මහණකෙනෙක් අඩයොදුනක්තුළ ඉන්නාවූ භික්ෂූන්ගේ කායවාක් අධ්‍යාචාරය දැනදැන අගතිගාමීව අනුශාසනා නොකර වෙසෙත් නම් එසේ වාසයකරණ මහණුන්ට දුකුලාඇවැත්වේ. සවකීය කර්මයෙන් තෙමේම ප්‍රකටවන්නේයයි කියාහෝ ගොස් අනුශාසනා

කළහොත් හිමි ප්‍රයෝජනයක් නොවේ ගුණදෙක් භණ්ඩන කලහ විග්‍රහ විවාද සංඝභේද සංඝරාජීම වැඩෙන් නේයයිනියා හෝ අනුශාසනා නොකර හරිත් නම් වැරැද්දක් සිදුවිය නොහැක්කේය. එහෙයින් “තෙ ච භික්ඛවෙ භික්ඛූ තස්ස භික්ඛුනො වචනෙන තං ආපත්තිං පටිකරෙය්‍යුං ඉච්චෙතං කුසලං නො චෙ පටිකරෙය්‍යුං න තෙ භික්ඛවෙ භික්ඛූ තෙන භික්ඛුනා අකාමා වචනීයා” යනුවෙන්ද, “භෙදගරුකෙහි භික්ඛවෙ භික්ඛූහි නාසො භික්ඛු ආපත්තියා අදස්සනෙ උක්ඛිපිතබ්බො” යනුවෙන්ද, “තෙන ඛොපන සමයෙන පෙසලා භික්ඛු ඡබ්බග්ගියෙ භික්ඛු ඔභාසං කාරාපෙත්වා ආපත්තියා චොදෙන්ති ඡබ්බග්ගියා භික්ඛු ලභන්ති ආඝාතං ලභන්ති අප්පච්චයං වධෙන තජ්ජෙන්ති භගවතො එතමත්ථං ආරොචෙසුං අනුජානාමි භික්ඛවෙ සතෙපි ඔකාසෙ පුග්ගලං තුලයිත්වා ආපත්තියා චොදෙතුං” යනුවෙන්ද, “අනුජානාමි භික්ඛවෙ චතූහි පඤ්චහි පටික්කොසිතුං ද්වීහි තීහි දිට්ඨිං ආවිකාතුං එකෙන අධිට්ඨාතුං නමෙතං ඛමතීති” යනුවෙන්ද වදාළේය. අටුවාවෙහිද “චතූහි පඤ්චහීති තෙසං අනුපද්දවත්ථාය වුත්තං” යනුවෙන් වර්ණනාකරණලදි.

භික්ඛවෙ, මහණෙනි; තෙ භික්ඛූ, ඒ භික්ෂූහු: තස්ස භික්ඛුනො, ඒ අනුශාසනාකළ භික්ෂුවගේ; වචනෙන, වචනයෙන්; තං ආපත්තිං, ඒ ඇවතට; චෙපටිකරෙය්‍යුං, ඉදින් පිළියම් කෙරෙත් නම්; ඉති එතං, එසේවූ ප්‍රතිකර්මය; කුසලං, යහපති; නොචෙපටිකරෙය්‍යුං, ඉදින් පිළියම් නොකෙරෙත් නම්; තෙන භික්ඛුනා, ඒ හිතකාමී අනුශාසක භික්ෂුව විසින්; අකාමා, නොකැමැත්තාහු නම්; නවචනීයා, අනුශාසනා නොකටයුත්තාහුය; භික්ඛවෙ, මහණෙනි; භෙදගරුකෙහි, සංඝභෙදය බියෙ

ගෝවි ගරුකරන්නාවූ; භික්ඛූහි, භික්ෂූන් විසින්; යො භික්ඛු, ඒ දුබ්බච භික්ෂුව, ආපත්තියා අදස්සනෙ, පැමිණි ඇවත නොදැකීම නිමිත්තකොට (හෙවත්) ඇවත නොබලන හෙයින්; උක්ඛිපිතබ්බො, සංඝයා කෙරෙන් නෙරපිය යුත්තෝය—තෙන ඛො පන සමයෙන, එසමයෙහි වනාහි; පෙසලා භික්ඛූ, ප්‍රියසීලි භික්ෂූහු; ඡබ්බග්ගියෙ භික්ඛූ, ෂඩ්වර්ග භික්ෂූන්ට; ඔකාසං කාරාපෙත්වා, චොදනාවට අවසරකරවා ගෙණ; ආපත්තියා, ඇවතින්; චොදෙන්ති, චොදනා කෙරෙත්; ඡබ්බග්ගියා භික්ඛූ, ෂඩ්වර්ග භික්ෂූහු; ආඝාතං ලභන්ති, ආඝාතය ලබත්; (වෛරබඳිත්) අප්පච්චයං ලභන්ති, අප්‍රසාදය ලබත්; (නොසතුටුවෙති) වධෙන, වධයෙන්; තජ්ජෙන්ති; තර්ජනයකෙරෙත්; භගවතො, භාග්‍යවතුන්වහන්සේට; එතං අත්ථං, මේ කාරණය; ආරොචෙසුං, සැලකළාහුය; භික්ඛවෙ, මහණෙනි; ඔකාසෙකතෙපි, චොදනාවට අවකාශකළ කල්හිදු; පුග්ගලං, පුද්ගලයා; තුලයිත්වා; කිරා (පුද්ගල ලක්ෂණ පරීක්ෂාකොට) ආපත්තියා, ආපත්තියෙන්; චොදෙතුං, චොදනාකරන්ට; අනුජානාමි, මම ආඥකරමි—භික්ඛවෙ, මහණෙනි; චතූහිපඤ්චහි, සතරපස්නමක්වූ භික්ෂූන් විසින්; පටික්කොසිතුං, මේ අධර්ම කර්මය නොකරවයයි වළකාළුන්ටත්; ද්වීහිතීහි, දෙතුන් නමවූ භික්ෂූන් විසින්; දිට්ඨිං, මේකර්මය අධර්ම කර්මයක යන ලබ්ධිය; ආවිකාතුං, ප්‍රකාශකරන්ටත්; එකෙන, එක් භික්ෂුවක් විසින්; එතං, ඒ අධර්ම කර්මය; මෙ, මාහට; නක්ඛමතීති, රුචි නොවේයයි; අධිට්ඨාතුං, (සිත් සතාන්හි) ඉටාගන්ටත්; අනුජානාමි, (මම) ආඥකරමි--චතූහිපඤ්චහීති, චතූහිපඤ්චහි යනවචනය; තෙසං, ඒ ප්‍රකෘති භික්ෂූන්ට; අනුපද්දවත්ථාය, අනුපද්‍රව පිණිස; වුත්තං, වදාරණලදී. (මේ කාලයෙහි

වනාහි අඩයොදුන්තුලීවාසයකරණ සමහරභික්ෂූන් නොයෙක් දුෂ්ප්‍රතිපත්තිවලැ යෙදී ගැලීවාසයකරණ බව දිඹසුනවශයෙන් දැනදැනම කරුණා මෛත්‍රී විරහිත හෙයින් කිසි මහණුන්නාන්සේ කෙනෙක් ගොස් අවවාදානුශාසනා කරණබවක් පෙණෙන්ට නැත්තේය. එය පෞරාණිකයන්ගේ සත්පුරුෂ ධර්‍මයට නම් කිසිසේත් සමනොවේ.)

උක්තප්‍රකාර සප්තවිධවිනයකර්‍මයන් අතුරෙන් කරණලද තර්‍ජනීයකර්‍මය ඇති භික්ෂුවවිසින් "කිත්තකංකාලං වත්තංපූරෙතබ්බන්ති දසවා පඤ්චවා දිවසානි ඉමස්මිංහි කම්මක්ඛන්ධකෙ එත්තකෙනාපි වත්තංපූරිතමෙව" (අඨ කථා.) කිත්තකංකාලං, කොතෙක්කල් මුළුල්ලෙහි; වත්තංපූරෙතබ්බං, වත පිරියයුතුද; ඉතිපුච්ඡා, මේ පෘච්ඡාවයි; දසදිවසානි වා, දසදිනයක් හෝ; පඤ්චදිවසානිවා, පස්දිනයක් හෝ; පූරෙතබ්බානි, පිරියයුත්තාහුය ("හි" යනු දළ්හී කරණද්‍යොතකයි) ඉමස්මිං කම්මක්ඛන්ධකෙ, මේකම්මක්ඛන්ධකයෙහි; එත්තකෙනාපි, දසදිනයක් හෝ පස්දිනයක් හෝ වූ මෙතෙක් කලයින්දු; වත්තං, වත; පූරිතමෙව, පූරණලද්දේමය—මෙසේ ආ හෙයින් දසදිනයක් හෝ පස්දිනයක් හෝ මුළුල්ලෙහි

උපසම්පදං නිස්සයං සාමණේරූපට්ඨාපනං,
ඔවාදං සම්මතොවාපි න කරෙ තජ්ජනීකතො.
නාපජ්ජෙ තඤ්ච ආපත්තිං තාදිසිඤ්ච තතොපරං
කම්මඤ්ච කම්මිකෙවාපි න ගරහෙ තථාවිධො.
උපොසථ පවාරණෙ පකතත්තස්ස නොඨපෙ
සවචනිං අනුවාදං ඔකාසං චොදනං පිච
සාරණං සම්පයොගඤ්ච නාකරෙය්‍ය තථාවිධො.

තජ්ජනීකතො, කරණලද තර්‍ජනීය කර්‍ම ඇති භික්ෂුතෙමේ; උපසම්පදං, උපාධ්‍යායයෙක්වී උපසම්පද

කර්මයද; නිස්සයං, ආගන්තුකව පැමිණෙන භික්ෂූන්ට නිසදීමද; සාමණෙරූපට්ඨාපනං, හෙරණුන් ලවා වත්පිළිවෙත් කරවාගැනීමද; ඔවාදං, භික්ඛුණොවාද සම්මුතිය ඉවසීමද; සම්මතෙනාපි, මුලදී ලද භික්ඛුනොවාද සම්මුති ඇති භික්ෂුවක් වූයේ නමුත්; ඔවාදං, භික්ෂුණීන්ට අවවාද කිරීමද; නකර, නොකරන්නේය; තථාවිධො, එසේ කරණලද තර්ජනීය කර්ම ඇති භික්ෂුතෙම; තස්ස ආපත්තිං, (තර්ජනීය කර්මයට හෙතුවූ) ඒ ආපත්තියටද; තාදිසිකං, තත්සදෘශාපත්තියටද; තතොපරං, තදධික ආපත්තියටද; නාපජ්ජ, නොපැමිණෙන්නේය; කම්මඤ්ච, තර්ජනීය කර්මයටද; කම්මිකෙචාපි, කාර්මික භික්ෂූන්ටද; නගරහෙ, ගර්හා නොකරන්නේය; තථාවිධො, එසේ කරණලද තර්ජනීය කර්මය ඇති භික්ෂුතෙම; පකතත්තස්ස, ප්‍රකෘතිභික්ෂුවහට; උපොසථ පවාරණා නොඨපෙ, පොහෝ පවුරුණු නොතබන්නේය; සවචනීං, කියයුතු වරද ඇතැයි කියා අන්තැනකට යානොදී වැළැක්වීමද; අනුවාදං, අධිපති තනතුරු පිළිගැනීමද; ඔකාසං, චොදනාවට අවකාශ ගැනීමද; චොදනංපිච, චොදනාව (දොෂාරොපණය)ද; සාරණං, වස්තු සාක්ෂ්‍ය පෙන්වා සිහිකරවීමද; සම්පයොගඤ්ච, භික්ෂූන් ඔවුනොවුන් හා විරුද්ධකරවීමද; නකරෙ, නොකරන්නේය.

මෙසේකියනලද අටළොස්වත නොපිරිහෙළා සම්පූර්ණකොට සංඝයාට සැලකර සිටිවිට පූර්ණලද අටළොස්වත ඇති ඒ භික්ෂුව සංඝයාවිසින් ඔසාරණ කර්ම වාක්‍යයෙන් ප්‍රකෘති සංඝයාවෙත ඇතුලත්කර මුලින් යම් ඇවතක්නිසා තර්ජනීය කර්මය කරණු ලැබීනම් ඒ ඇවතට පිළියම් කරවියයුත්තේය. උක්තප්‍රකාරයෙන් සංඝයාවෙත ඇතුලත් කරගැනීමට පළමුවෙන්ද මේ භික්ෂුව පිරිවෙස්මානත් පූර

මින් සාරානු එතෙක් හැසිරෙණ භික්ෂුව මෙන් ප්‍රකෘති සංඝයාවහන්සේ සමග සමාන සම්භෝගියෙක්මය. ඉදිනා කියනලද අටළොස්වතෙහි නොහැසිරේනම් සංඝයා එවන ඇතුලත් නොකටයුතුවා පමණක් නොව අලජ්ජී වූ හෙයින් ප්‍රත්‍යය ධර්මය යන උභය සම්භොගයම ඒ භික්ෂුව සමග නොකටයුත්තේය. උපොසථපවාරණ කර්මාකර්ම සංඛ්‍යාත (කුඩා මහත් විනයකර්ම) සංවාසයවූකලී නොකටයුතුයයි වදාළ පෙළි අටුවා වචනයක් නැත්තේය. කරණලද නියස්සකර්මය ඇති පුද්ගලයා සම්බන්ධ විනිශ්චයද මෙතනින් දතයුතු. "නිස්සායතෙ වත්ථබ්බන්ති ගරුසන්නිස්සයං සන්ධාය වුත්තං න ඉතරං" (වජිරබුද්ධි ටීකා ගණ්ඨිපදෙසුපන) "නියස්සකම්මං යස්මා බාල අබ්‍යත්ත වසෙන කරීයති තස්මා නිස්සාය වත්ථබ්බන්ති නිස්සයං ගාහාපෙතබ්බොති වුත්තං" (සාරත්ථදීපනී ටීකා). නිස්සායතෙවත්ථබ්බන්ති, නිස්සායතෙ වත්ථබ්බං යන වචනය; ගරුසන්නිස්සයං, ගරුසත් නිශ්‍රය; සන්ධාය, සඳහා; වුත්තං, කියනලද්දේය; ඉතරංසන්ධාය, ඉතුරු නිසයමාදත්වීම සඳහා; න වුත්තං, නොකියනලදී; ගණ්ඨිපදෙසුපන, ගණ්ඨිපදයන්හි වනාහි; නියස්සකම්මං, නියසකර්මය; බාල අබ්‍යත්තාවසෙන, බාල අව්‍යක්ත භික්ෂූන්ගේ වශයෙන්; යස්මාකරීයති, යම්හෙයකින්කරණුලැබේද; තස්මා, එහෙයින්; නිස්සායවත්ථබ්බන්ති, නිස්සාය වත්ථබ්බං යනුවෙන්; නිස්සයං ගාහාපෙතබ්බොති, නිශ්‍රයග්‍රහණයකරවියයුත්තේයයි; වුත්තං, කියනලදී—මෙසේ ආහෙයින් කරණලද නියස්සකර්මය ඇති ඒ භික්ෂුව ගුරුවරයා සමීපයෙහි නවත්වා ගෙණ අටළොස්වත පිරවියයුත්තේය. කරණුලැබූ පබ්බාජනීය කර්මය ඇති පුද්ගලයා විසින්ද වසනලද ග්‍රාමයෙන් වසනලද ආරාමයෙන් පිටපලාත කට නික්මගොස් අටළොස්වත පිරියයුත්තේය.

කරණලද පටිසාරණීයකර්මය ඇති දණ්ඩාර්හ පුද්ගල
යා එසිත්ද අටලොස්වන පුරම්හිම දශකයාකරා
ගොස් ක්ෂමාකරවාගතයුත්තේය. මෙසේ කියන
ලද කර්මචතුෂ්කය ලඝුකර්ම නම්වේ. උත්ක්ෂේපණීය
කර්මත්‍රිකය ගරුකර්ම නම්වේ. එහෙයින් කරණලද
උත්ක්ෂේපණීය කර්ම ඇති භික්ෂුව විසින් නොසාලිස්
වතක් පිරියයුත්තේය. කර්මවාක්‍යයෙහි "ඉත්ථන්නා
මස්ස භික්ඛුනො උක්ඛෙපනීය කම්මං කරෙය්‍ය
අසම්භොගං සංඝෙන" ඉත්ථන්නාමස්ස භික්ඛුනො;
මේ නම් ඇති භික්ෂුහට; සංඝෙන අසම්භොගං,
සංඝයා හා සමගිසම්භොගය නොකිරීම පිණිසවූ
(නොහොත්) සමඟසම්භොගය නොකිරීමටහේතුවූ
උත්ක්ෂේපණීයකර්මය; කරෙය්‍ය, කරන්නේයයි
කියාද; මාතෘකාවෙහි "යොපන භික්ඛු ජානං තථා
වාදිනා භික්ඛුනා අකතානු ධම්මෙන තංදිට්ඨිං අප්ප
නිස්සට්ඨෙන සද්ධිං සම්භුඤ්ජෙය්‍යවා සංවසෙය්‍යවා
සහවාසෙය්‍යං කප්පෙය්‍ය පාචිත්තියං" යොපන
භික්ඛු; යම් භික්ෂුවක්තෙම; ජානං, උත්ක්ෂිප්තක
භාවය දැනදැන; තථාවාදිනා, එසේවූ මිථ්‍යාවාද
ඇත්තාවූ; අකතානුධම්මෙන, නොකරණලද අව
සාරණ නමැති අනුධර්ම ඇති; තං දිට්ඨිං, ඒ මිථ්‍යා
ලබ්ධිය; අප්පටිනිස්සට්ඨෙන, නොහළුවාවූ; භික්ඛු
නාසද්ධිං, භික්ෂුව සමග; සම්භුඤ්ජෙය්‍යවා, ධර්මා
මිෂයෙන් සම්භොගකෙරේනම් හෝ, සංවසෙය්‍යවා,
සමග ක්ෂුද්‍රානු ක්ෂුද්‍ර කර්මකෙරේ නම් හෝ; සහවා
සෙය්‍යං කප්පෙය්‍ය, එකූපචාර එකච්ඡන්නයෙහි
එක්ව හොවිනම් හෝ; පාචිත්තියං, පචිති ඇවැත්
වේ—මෙසේද ආහෙයින් ඒ උත්ක්ෂිප්තක භික්ෂුහු
සමග සම්භොග සංවාස සහසෙය්‍ය තුනම නොවටී
"ආවාස පරම්පරඤ්ච භික්ඛවෙ සංසථ" භික්ඛ
වෙ, මහණෙනි; ආවාසපරම්පරඤ්ච, ආවාස පරම්
පරාවද; සංසථ, ඝොෂණයකර කියව්; යනුවෙන්ද
අනුදැන වදාළේය.

"සම්භොගො නාම වෙසම්භොගා ආමිස සම්භොගො ධම්ම සම්භොගොච තත්ථ ආමිස සම්භොගොනාම ආමිසං දෙතිවා පටිග්ගණ්හාතිවා ආපත්ති පාචිත්තියස්ස. ධම්ම සම්භොගො නාම උද්දිසතිවා උද්දිසාපෙතිවා පදෙන උද්දිසතිව උද්දිසාපෙතිවා පදෙපදෙ ආපත්ති පාචිත්තියස්ස. අක්ඛරාය උද්දිසතිවා උද්දිසාපෙතිවා අක්ඛරක්ඛරාය ආපත්තිපාචිත්තියස්ස" (අරිට්ඨසික්ඛාපදපාළි). සම්භොගො නාම; සම්භොගය නම්; ආමිස සම්භොගොච, ආමිෂ සම්භොගයද; ධම්ම සම්භොගොච ඉති, ධර්මසම්භොගයදැයි; සම්භොගා, සම්භොගයෝ; වෙ, දෙදෙනෙකි; තත්ථ, ඒ දෙවැදෑරුම් සම්භොගයන් අතුරෙන්; ආමිස සම්භොගොනාම; ආමිෂ සම්භොගය නම්; ආමිසං දෙතිවා, චීවරාදී ආමිෂයදේ නම් හෝ; පටිග්ගණ්හාතිවා, අලජ්ජිසන්තක චීවරාදි ආමිෂය පිළිගනීනම් හෝ; පාචිත්තියස්ස, පචිති ඇවතට; ආපත්ති, පැමිණීමවේ; ධම්ම සම්භොගො නාම, ධර්ම සම්භොගය නම්; උද්දිසතිවා, උදෙසා නම් හෝ (පාළිධර්මය උගන්වා නම් හෝ) උද්දිසාපෙතිවා; උදෙසවා නම් හෝ (උගන්වාගනීනම් හෝ). පදෙපදෙ, පදයක්පාසා; පාචිත්තියස්ස, පචිති ඇවතට; ආපත්ති, පැමිණීමවේ; අක්ඛරාය, අක්ෂරයෙන්; උද්දිසතිවා, උදෙසා නම් හෝ; උද්දිසාපෙතිවා, උදෙසවා ගනීනම් හෝ; අක්ඛරක්ඛරාය, අකුරක්පාසා; පාචිත්තියස්ස, පචිතිඇවතට; ආපත්ති, පැමිණීමවේ--මෙසේ ආවාවූ දෙවැදෑරුම් සම්භොගය ම උත්ක්ෂිප්තකාහිකණුව සමග කිරීමට කිසිම පර්‍යාය කාරණාලෙසයකුත් නැත්තේය. උත්ක්ෂිප්තනොවූ අලජ්ජියාහට වූකලී "අලජ්ජිනා සද්ධිං පරිභොගො නාම අලජ්ජිස්ස සන්තකං ගහෙත්වා පරිභොගො" අලජ්ජිනා සද්ධිං, අලජ්ජියා හා සමග; පරිභොගො.

නාම, පරිභොගය නමි; අලජ්ජිස්ස සන්තකං,
අලජ්ජියා සතුවූ පසය; ගහෙත්වා, ගෙන; පරි
භොගො, පරිභොගයකි—මෙසේ ඊකාගත පරිද්
දෙන් අලජ්ජියාගට තමසතු පස දීමෙන් අලජ්ජි
පරිභොගය නොවේ. අලජ්ජියාසතු පස ගෙන
පරිභොග කළහොත් ආමිෂ සම්භොගයවේ. ඉදින්
අලජ්ජීන්සතු පස නමුත් ධාර්මික නම් තම
සතන්හි ක්‍රොධසංසිඳී මෛත්‍රීභාවනා සිද්ධසඞ්ඛ්‍යාත
ධර්මානුග්‍රහය පිණිස පිළිගතයුතුවාක්මෙන් විශුද්ධි
මාගී මෛත්‍රී භාවනා නිර්දේශයෙහි "සචෙපනාපරෙ
හීනාජීවො හොති අපරිභොගාරහ පරික්ඛාරො
අත්තනො සන්තකමෙව දාතබ්බං තස්සෙවං කරො
තො එකන්තෙනෙව තස්මිං පුග්ගලෙ ආඝාතො වූප
සම්මති" යන ව්‍යාක්‍යායාගේ ව්‍යතිරෙකන්‍යායයෙන්
පෙනේ--පරෙ, වෛරී භික්ෂුතෙම; අපරිභොගාරහ
පරික්ඛාරො, පරිභොගාහී පරිෂ්කාර නැත්තේ;
හීනාජීවො, හීනවූ ආජීවයඇත්තේ; සචෙපන
හොති, ඉදින් වූයේනම්; අත්තනො සන්තකමෙව;
තමාසතු දෙයම; දාතබ්බං, දියයුතුය; එවං කරො
තො, මෙසේ කරන්නාවූ; තස්ස, ඒ යොගී පුද්ගල
යාහට; එකන්තෙනෙව, ඒකාන්තයෙන්ම; තස්මිං
පුග්ගලෙ, ප්‍රත්‍යයබලයෙන් පහලවූ සෞම්‍ය ගති
ඇති ඒ වෛරී පුද්ගලයා කෙරෙහි; ආඝාතො, නම
සතන්හි ඇතිවූ ආඝාතය; වූපසම්මති, සංසිඳේ;
මෙහි ව්‍යතිරෙක න්‍යායයෙන් ඒ අලජ්ජියාසතු
පසය ඉදින් පරිභොගාහී දැහැමිපසයක් වීනම් පිළි
ගතයුතු බවද පෙනේ. — බුරුමරට මෙංඩුං මහරජ
තුමන්විසින් පාෂාණග්‍රන්ථයක්මෙන් ගරුකාරණලද
සුපෙසල ශික්ෂාකාමිභාවයෙන් අතිප්‍රසිද්ධව වැඩවිසූ
(ශංකල්වුංසයාඩෝ) යන අපරනාමධෙයයක් ඇති
ළඹ. නන්දාභිධාන මහ තෙරණුවෝ සැකසනිත

පුද්ගලයෙක් යම් පසයක් ගෙණ අවුත් මවුපියන් ගෙන් ලැබූ පසයක්ය කියා ඉදින් පූජා කෙරේනම් පසය අසිනි පුද්ගලයාකෙරේ සැකසහිත හෙයින් පිළිනොගණිම්යයි භාණ්ණිමහුතව හිඳිති. පසය ගෙනාවුන් පූජාකළ ආගන්තුක භික්ෂුව නැගිට ගියකල්හි පසුව මහණහු පංසුකූල සංඥාවෙන් ගෙන පරිභොග කෙරෙති. එසේ දෙමව්පියාදි කොනොකුගෙන් කැපසරුප්ලෙස ලද පසයක්යයි ඉදින් සැලනොකළ පසයක් නම් කැපකරුවන් විසින් ගෙන පරිභොග කරණුලැබේ. ජාගර මහ තෙරුන්වහන්සේගේ උපාධ්‍යායාචාර්‍ය්‍යභූත (සල්ලංස යාමෙයි) යන අපර නාමධෙයයක් ඇති වෙළි මාලබිකාර මහ තෙරුන්වහන්සේ අලජ්ජියෙක් යම් පසයක් ගෙනාවුන් පිළුවහොත් පරිභොග නොකෙරමියි මනස්කාරය පිහිටුවා පිළිගෙන කැපකරුවන්ට විසර්ජනය කළේය. එහෙයින්, “සමෙව පුගගලොපි අලජ්ජී පිණ්ඩපාතොපි අධම්මියො පච්චයො න ගහෙතබ්බො” යනාදි චතුෂ්කය පරිච්ඡෙදන් ඉදින් අලජ්ජියෙකු විසින් දෙනලද දෙය නොගණිමියි ප්‍රතික්ෂෙපකිරීමෙන් ඒ අලජ්ජියා බියපත්ව මදරතිනයෙක් වේනම් ඒ අලජ්ජීයාගේ සම්මුඛයෙහිම ඒ පසය ප්‍රතික්ෂෙප කටයුතු.

ඉදින් මදරතිනයෙක් නොව කලහකාරකයෙක්වේයයි වැටහේනම් පරිභොගකරන්නෙමියයි ආශවාද නොකොට පිළිගෙන විසර්ජනය කටයුතු. ඒ එසේමය. තමා සමීපයෙහි දමාගිය රන්රිදී මසුකහවණු පවා ඉදින් ආශවාදය නොකෙළේ නම් කැපවේ. එහෙයින් මෙහි කියනුමනීම—ධර්ම සම්භොගයද මේනයින් දතයුතු. අලජ්ජීන්ගෙන් ඉගෙණීම නොකටයුතු. ඉගැන්වීම වනාහි අලජ්ජියාටද කටයුතුමය—ඒ එසේමැයි. උගන්වන

අනර වචනයෙන් වචනය කියාදීමෙන්ම නොබෝ කලකින්ම ඒ අලජ්ජියා ලජ්ජී ධර්මයෙහි පිහිටිය හැක්කේය—මේ ධර්ම සම්භෝගයෙහි පෙළෙහි ඉගෙණීම ආහෙයින්ද අර්ථ කථායෙහිත්,

“යොපන කොටිසංඨිතො ගන්ථො තස්ස පුග්ගලස්ස අච්චයෙන නස්සිස්සති, තංධම්මානුග්ගහෙන උග්ගණ්හිතුංවට්ටති”—කොටිසංඨිතො, අතුරුදන් වීමට ආසන්නව කෙලිතැන්හි පිහිටියාවූ; යොපන ගන්ථො, යම් ග්‍රන්ථයක් ; තස්ස පුග්ගලස්ස, ඒ ග්‍රන්ථධාරී අලජ්ජීපුද්ගලයාගේ; අච්චයෙන, ඇවෑමෙන්; නස්සිස්සති, නැසෙන්නේනම් (හෙවත්) නැතිවන්නේනම් ; තං, ඒ ග්‍රන්ථය; ධම්මානුග්ගහෙන, ධර්මානුග්‍රහයෙන්; උග්ගණ්හිතුංවට්ටති, උගන්නටවටී යයි මෙසේ ඉගෙණීමම ආහෙයින්ද ”සංවසෙය්‍ය වාති උක්ඛිත්තකෙනසද්ධිං උපොසථංවා පවාරණංවා සංඝකම්මංවා කරොන්ති ආපත්ති පාචිත්තියස්ස” සංවසෙය්‍යවාති, සංවසෙය්‍යවා යනු ; උක්ඛිත්තකෙනසද්ධිං, උත්ක්ෂෙපණීයකර්ම්ය කරණකොටගෙන සංඝයාකෙරෙන් නෙරපනලද භික්ෂුව හා සමග ; උපොසථංවා, උපෝසථ කර්ම්ය හෝ ; පවාරණංවා, පවාරණ කර්ම්ය හෝ; සංඝකම්මංවා, අනිරිකත සංඝ කර්ම්චතුෂ්කය හෝ ; කරොන්ති, කෙරේ නම් ; පාචිත්තියස්ස, පචිති ඇවතට ; ආපත්ති හොති, පැමිණීමවේ.—

මෙසේ පාලියෙහි සම්භෝගයෙන් වෙනස්ව ආවාවූ කර්මාකර්මසංවාසයද ; “නභික්ඛවෙ අලජ්ජීනං නිස්සාය වත්ථබ්බං යො වසෙය්‍ය ආපත්ති දුක්කටස්ස න භික්ඛවෙ අලජ්ජීනං නිස්සයො දාතබ්බො යො දදෙය්‍ය ආපත්ති දුක්කටස්ස”—භික්ඛවෙ, මහණෙනි ; අලජ්ජීනං, අලජ්ජීන් (නොහොත්) අලජ්ජීන්ගේ අවවාදය; නිස්සාය, නිසා ; නවත්ථබ්බං,

නොවිසියයුතු ; යො, යම් ලජ්ජී මහණෙක් ; වදෙය්‍ය, වාසය කලේ නම් ; අස්ස, ඒ ලජ්ජී මහණහට ; දුක්කටාපත්ති, දුකුළා ඇවතක් ; අස්ස, වන්නීය ; භික්ඛවෙ, මහණෙනි; අලජ්ජීනං, අලජ්ජීන්ට ; නිස්සයො න දාතබ්බො, නිසය නොදියයුතු; යො, යම් ලජ්ජී මහණෙක්තෙම ; දදෙය්‍ය, නිස දෙන්නේ නම් ; තස්ස, ඒ මහණහට ; දුක්කටස්ස, දුකුළාවට ; ආපත්ති හොති, පැමිණීම වේ.

මෙසේ බන්ධකයෙහි ශික්ෂාපදවශයෙන් වේ නම ආවාවූ නිශ්‍රයග්‍රහණදාන වන්දනාදියද ධර්‍ම පරිභොගයෙහි ඇතුළත්කොට "ධම්මපරිභොගොති එකකම්මං එකුද්දෙසොති ආදිනා වුත්තසංවාසොචෙව නිස්සයගහණදානාදිකොසබ්බොනිරාමිසපරිභොගොච වෙදිතබ්බො ධම්මාමිසපරිභොගවිවජ්ජනෙනාපිහි දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහො අධිප්පෙතො සොච පෙසලානං ඵාසුවිහාර සද්ධම්මට්ඨිති විනයානුග්ගහාදි අත්ථාය එතදත්ථාතා සික්ඛාපද පඤ්ඤත්තියා තස්මා යංයං දුම්මඞ්කූනං උපත්ථම්භාය පෙසලානං අඵාසුවිහාරාය සද්ධම්මපරිහානාදි අත්ථාය හොති තංසබ්බම්පි පරිභොගොවා හොතු අපරිභොගොවා සාතුං නවට්ටති එව කරොන්තො සාසනං අනත්ථාධාපෙන්ති දුක්කටඤ්ච ආපජ්ජන්ති" – ධම්ම පරිභොගොති, ධම්ම පරිභොගය යනු ; එකකම්මං එකුද්දෙසොති ආදිනා, එක කම්මං එකුද්දෙසො යනාදියෙන් ; වුත්තසංවාසොචෙව, වදාරණලද සංවාසයද ; නිස්සයගහණදනාදිකො, නිසගැණීම්, නිසදීම් ආදිවූ ; සබ්බො නිරාමිස පරිභොගොච ; සියළු නිරාමිෂ පරිභොගයද ; වෙදිතබ්බො, දතයුතු ("නි" ශබ්දය දළනී කාරණද්‍යතකයි) ධම්මාමිස පරිභොග විවජ්ජනෙනාපි, ධර්‍මපරිභොගආමිසපරිභොගවිවර්ජිතයෙන්ද;

දුම්මඞ්කූනං පුග්ගලානං, අලජ්ජී පුද්ගලයන්ට; නිග්ගහාය, නිග්‍රහය ; අධිප්පායො, අදහස්කරණ ලද්දේය ; සොවචිග්ගාමෙහා, ඒ නිග්‍රහයද ; පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරත්ථාය, ප්‍රියශීලී ලජ්ජීන්ගේ පහසු විහරණය සද්ධර්මයාගේ චිරස්ථිතිය විනයානුග්‍රහය ආදී අර්ථය පිණිස; හොති, වේ; සික්ඛාපදපඤ්ඤත්තිය, ශික්ෂාපදප්‍රඥප්තියගේ; එතදත්ථතා, එයම ප්‍රයෝජනකොට ඇත්තෙහයින්, තස්මා, එහෙයින්; යං යං, යම් යම් ක්‍රියාවක් ; දුම්මඞ්කූනං උපත්ථම්භාය, අලජ්ජීන්ට උපස්ථම්භ පිණිසද ; පෙසලානං අඵාසුවිහාරාය, ප්‍රියශීලීන්ට අපහසුවිහරණය පිණිසද ; සද්ධම්ම පරිහානාදි අත්ථාය, සද්ධර්ම පරිහානාදි අර්ථය පිණිසද ; හොති, වේද ; තං සබ්බං, ඒ සියල්ල ; පරිභොගෙනවා, පරිභොගවශයෙනි ඇතුලත්වූයේ හෝ වේවා ; අපරිභොගෙනවා, පරිභොගවශයෙනි ඇතුලත්නුවූයේ හෝ වේවා ; සාතුං කරන්තාව ; නාවට්ටතිඑව, නොවටනේමය (එව යිදපායයි) එවං කරොන්තා, මෙසේ කරන්නාවූ පුද්ගලයෝ; සාසනං, ශාසනය; අන්තරධාපෙන්ති, අතුරුදන් කෙරෙත් ; දුක්කටඤ්ච, දුකුළාවද ; ආපජ්ජන්ති, පැමිණෙති.

මෙසේ ඇවත් නියමකලාවූ විමතිවිනොදනී ටීකාචාර්යයන්ගේ වචනයට පෙළ අටුවා දෙක්හිම සාධකයක් නොමැතිවා පමණකුත් නොව යුක්තියක්ද නොපෙනේ. ඉදින් " සම්භුඤ්ජෙය්‍යවා " යන්න සමග ආහෙයින් " සංවසෙය්‍යවා " යනුද ගැනේයයි කියන්නම් " සහවා සෙය්‍යං කප්පෙය්‍ය " යනුද ගෙණ අලජ්ජීන් සමග එකාවාසයෙහි හිඳීමෙන් ඇවැත්වියයුතුය. එහෙයින් " සංවසෙය්‍යවා සහවාසෙය්‍යං කප්පෙය්‍ය " යන පදවයම ගතනාගත යුත්තේය. " භගවතා පඤ්ඤත්තානං නාපත්තිකො

න උපොසථො කාතබ්බොති (ඛණ්ඩක) පාරිසුද්ධිං ආයස්මන්තො ආරොචෙථාති ආදිනානයෙන සාපත්තිකස්ස උපොසථකරණෙ පඤ්ඤත්තං දුක්කටං ආපජ්ජන්ති" (කඞ්ඛාවිතරණී අට්ඨකථා). සාපත්තිකෙන, ඇවත් සහිත භික්ෂුහු විසින් ; උපොසථො, උපෝෂථය ; නකාතබ්බො, නොකටයුතු ; ඉති, මෙසේ ; භගවතා, භාග්‍යවතුන්වහන්සේ විසින්; පඤ්ඤත්තං, පණවනලදි; "පාරිසුද්ධිං…පෙ…නයෙන, පාරිසුද්ධිං ආයස්මන්තො ආරොචෙථ" යනාදී ක්‍රමයෙන්, සාපත්තිකස්ස, ආපත්ති සහිත භික්ෂූහුගේ ; උපොසථකරණෙ, උපෝෂථකරණය නිමිතිකොට ; පඤ්ඤත්තං, පණවනලද ; දුක්කටං, දුකුළාවට ; ආපජ්ජන්ති, පැමිණෙත්…

මෙසේ පෙළි අටුවා දෙක්හි ආහෙයින් සාපත්තිකව පොහෝකිරීම වරද සහිතයි. සංඝාදිසෙසාදී ෂඩ්විධ ආපත්තිස්කන්ධයන් අතුරෙන් යම් ආපත්තිස්කන්ධයකින් සාපත්තිකව පාමොක් අසානම් නිදානාවසානයෙහි සහ ඒ ඒ උද්දෙස අවසානයෙහිත් දුකුළා ඇවත්වලට පැමිණේ. මෙසේ සාපත්තික භික්ෂුවටම ඒ ඒ ආපත්තීන්ගේ යාවතතියානුශ්‍රාවනාවසානයෙහි ඇවැත්වේ. නිරාපත්තික භික්ෂුවට ඇවැත් සිදුවේයයි කියා නැත්තේය. උපෝෂථප්‍රවාරණයෙන් පිටත් අන්‍ය කර්මයන්හි සාපත්තික භික්ෂූන්ටපවා ඇවත් සිද්ධවේයයි නොවදාළේය…

"සභාගාපත්තියා'ති සංඝස්ස පත්තකල්ලං නාම නහොති තෙනවුත්තං සභාගාපත්තියො න විජ්ජන්තීති එතාසුහි සභාගාපත්තිසු අවිජ්ජමානාසු විසභාගාපත්තිසු විජ්ජමානාසු පත්තකල්ලං හොතියෙව" (කඞ්ඛාවිතරණී අට්ඨකථා.) සභාගාපත්තියා, වස්තුසභාගවූ ආපත්තියක්; සති,

සියළු සංඝයාට ඇතිවූ කල්හි ; සංඝස්ස, සංඝයාගේ ; කම්මං, කර්මය ; පත්තකල්ලං නාම, ප්‍රාප්ත කාල ඇත්තේ නම් ; නහොති, නොවේ ; තෙන, එහෙයින් ; සභාගාපත්තියො නවිජ්ජන්තීති, නා විජ්ජන්තියයි ; වුත්තං, කියනලදී ; ("හි" ශබ්ද දළ්හීකරණද්‍යොතකයි) එතාසු සභාගාපත්තීසු, ඒ සභාගාපත්තීන් ; අවිජ්ජමානාසු, අවිද්‍යමානවූ කල්හි ; විසභාගාපත්තීසු, වස්තු විසභාග ආපත්තීන්; විජ්ජමානාසුපි, විද්‍යමාන කල්හිදු ; පත්ත කාල්ලං, ප්‍රාප්ත කාලය ඇත්තේ ; හොතියෙව, වේමැයි.

මෙසේ ආහෙයින් සියළු සංඝයාවහන්සේ වස්තු සභාග ආපත්තියකින් සාපත්තිකයෝ වෙත්නම් ඔවුනොවුන් ඇවැත් දෙසීමෙන් පිළියම් කරගැණීම වරද සහිතය.- පිළියම්නොකොට සාපත්තිකව උපෝෂථකිරීමත් සදොෂයි. එසේ හෙයින් සංඝයාගේ කර්මය ප්‍රාප්ත කාල ඇත්තේ නොවේ. විසභාගාපත්තියකින් සාපත්තිකවීමෙන් ඔවුනොවුන් ඊට පිළියම් කටයුතුවූ හෙයින් එසේ කොට පාමොක් අසන භික්ෂූන්ට ඇවැත්නොවේ. එහෙයින්ම සංඝයාගේ කර්මය ප්‍රාප්තකාල ඇත්තේ වේ. එහෙයින් පොහෝපවුරුණුවලදී පාරාජිකා නොවූ අලජ්ජීන් සිටියත් එයින් ලජ්ජී සංඝයාට නොව අලජ්ජීන්ටම ඇවත් සිදුවන්නේය. පොහෝපවුරුණුවලින් පිටත්කර්මයන්හි ඒ අලජ්ජීන්ට පවා ඇවත් සිදුනොවන බව දතයුතු.

ගහට්ඨො භික්ඛුණී සික්ඛ-මානා සික්ඛාපච්චක්ඛිපො
සාමණේරො සාමණෙරී-පාරාජිකොච සාසනං.

උක්ඛිත්තා නානථෙය්‍ය-සංවාසකොච පණ්ඩකො
තිත්ථායතන මාපන්නකා-ආනන්තරිය කම්මිකා.

තිරච්ඡො භික්ඛුණීදූසකො-උභතොබ්‍යඤ්ජනකාඉමෙ
වජ්ජනීයාති විඤ්ඤෙය්‍යා-ඒකවීසති පුග්ගලා..

මෙසේ අට්ඨකථායෙහි දක්වනලද එක්විසි පුද්ගලයන් කෙරෙහිද අලජ්ජීයා අත්පසින් දුරු කටයුත්තෙතැයි නොදක්වනලදි. ඒ එසේමය. ඉදින් අලජ්ජී පුද්ගලයා දෙරියන්හමාරක් අත් පසින් දුරුකරණුලැබුවහොත් කර්‍මය වග්ගී කර්‍මය වේ. සීමාවෙන් පිට නෙරපනු ලැබුවහොත් දුළොදස ශික්ෂාපදයෙහි "නත්ථි තයාසද්ධිං උපොසථොවා පවාරණංවා සංඝකම්මංවාති වදති ආපත්ති දුක්කටස්ස"—තයාසද්ධිං, තා හා සමග; උපෝසථොවා, පෝහෝ කිරීමද; පවාරණංවා, පවුරුණු කිරීමද; සංඝ කම්මංවා, අන්‍ය චතුර්විධ සංඝ කර්‍ම කිරීමද; නත්ථි, නැත්තේය; ඉති වදති, මෙසේ කියයි නම්; දුක්කටස්ස, දුකුලා ඇවතට; ආපත්ති හොති, පැමිණේවේ.. මෙසේ ආහෙයින් "වත්ථු සන්දස්සනා ආපත්ති සන්දස්සනා සංවාස පටික්ඛෙප සාමීචි පටික්ඛෙප" යන චතුර්විධ චෝදනා අතුරෙන් සංවාස පටික්ඛෙප චෝදනාවෙන් (පාරාජිකාවෙන්) චෝදනාකිරීමක් වූහෙයින් චෝදකයන්ගේ අභිප්‍රායානුකූලව දුකුලා ඇවත් සඟ වෙසෙස් ඇවත් සිදුවියහැකි. අසංවාස පුඟුලෝද

උක්ඛිත්තානුප සම්පන්නා
භික්ඛුණිච්ඡින්න මූලකො
නානාසංවාස නිස්සීම
ඨිතවෙහාස සණ්ඨිතා
එකාදස අභබ්බාච
අසංවාසාති දීපිතා.. (ඛුද්දකසික්ඛා)

උක්ඛිත්තා, උක්ඛෙපනීකම් කරණලද කර්‍මනානා සංවාසකයාද; අනුපසම්පන්නා, උපසම්පන්නා නුවූයේද; භික්ඛුණී, මෙහෙණද; ඡින්නමූල

ගතා, පරිජිඅවත්තේද ; නානාසංවාස නිස්සීම ඨිත වේහාස සණ්ඨිතා, ලද්ධිනානාසංවාසකය සීමින් බැහැරසිටියේය ආකාශයෙහි සිටියේය යන තිදෙනාද ; එකාදස අභබ්බාච, පණ්ඩකය ථෙය්‍යසංවාසකය තිත්ථියපක්කන්තකය තිරශ්චීනය ආනන්තරිය කාර්මිකයන් පස්දෙනය භික්ෂුණීදූෂකය උභතොව්‍යඤ්ජනකය යන එකොළොස් අභව්‍ය පුද්ගලයෝද ; අසංවාසාති, අසංවාසයගයි ; දීපිතා, දක්වනලදහ෴ මෙසේ අටළොස්දෙනෙක්ද උක්ඛිත්තකයා තුන්දෙනෙක්කොට බෙදූවහොත් සම විසිදෙනෙක්ද වෙති෴

විමතිච්ඡේදනී ටීකාචාර්‍ය්‍යී මතයෙන් වනාහි අලජ්ජීයාද ඇතුලත්කොට ගැනීමෙන් විසිඑක්දෙනෙක්වී පෙළ අටුවා දෙකටම විරුඬවේ. බොහෝ පවුරුණු හා කුඩා මහත් විනයකර්ම සියල්ලක් සංවාසමාත්‍රයමුත් සම්භෝග පරිභෝගවලට ඇතුලත් නොවේ. එහෙයින්ම එය එක් යොදුන් දෙයොදුන් තුන් යොදුන් පමණ සීමාවක්තුළ ඇතිතාක් ප්‍රකෘති සියළු භික්ෂූන්ගේ කෘත්‍යයකි෴

ලජ්ජී හෝ අලජ්ජී හෝ සියළු භික්ෂූන් විසින්ම ඇත්පසට හෝ පැමිණියයුතු. ඡන්දපාරිශුද්ධිය හෝ දියයුතු. හුදෙක් වර්ගකර්ම නොකරන්නාවූ කර්මනානාසංවාසක ලද්ධිනානාසංවාසක අන්තිම වත්ථු අපේක්ඛාපන්න පුද්ගලයන් තුන්දෙන පමණක් සීමාවතුලට නොගෙණ පහකළයුත්තෝ වෙති. එහෙයින් "සංවාසො නාම එකකම්මං එකුද්දෙසො සමසික්ඛතා එසො සංවාසො නාම" යන පදභාජනී වර්ණනා අට්ඨකථායෙහි "චතුබ්බිධම්පි සංඝකම්මං සීමාපරිච්ඡින්නාහි පකතත්තෙහි භික්ඛූහි එකතොකාතබ්බත්තා එකකම්මං නාම

තථා පඤ්චවිධම්පි පාතිමොක්ඛුද්දෙසො එකතො උද්දිසිතබ්බත්තා එකුද්දෙසො නාම " යි වණ්ණනා කොළේය…

තත් ටීකාවන්හිද "පකතත්තා නාම පාරාජිකං අනාපන්නා අනුක්ඛිත්තාච" යි වණ්ණනා කරණලදි… සංවාසො නාම, සංවාසය නම් ; එකකම්මං, සමග කටයුතු සංඝ කර්මචතුෂ්කය ; එකුද්දෙසො, ශීමසථ වූ සියළුම ප්‍රකෘති භික්ෂූන් විසින් සංඝ උපොෂථ වශයෙන් සමග උදෙසියයුතු (උච්චාරණ කටයුතු) පාතිමොක්ඛුද්දෙස පඤ්චකය; සමසික්ඛතා, සමගියෙන් පිළිපදින මහණුන්ගේ ලජ්ජීභාවයට නිමිත්ත වූශික්ෂාපදසමූහයයත; එසො, මේ ත්‍රිකය; සංවාසො නාම, සංවාස නම්වේ ; පකතත්තා නාම, ප්‍රකෘති භික්ෂු ස්වභාවය ඇත්තෝ නම් ; පාරාජිකං, පරිජි ඇවතට ; අනාපන්නාච, නොපැමිණියාවූද ; අනුක්ඛිත්තාච, උත්ක්ෂිප්ත නොවූද භික්ෂුහුයි…

" සමසික්ඛතා " පදය වනාහි, " පඤ්ඤත්තංපන සික්ඛාපදං සබ්බෙහිපි ලජ්ජීපුග්ගලෙහි සමං සික්ඛිතබ්බභාවතො සමසික්ඛතා නාම"යයි (අට්ඨකථායෙහිද) "නහාපිතපුබ්බකානං ඔධිසානුඤ්ඤාතං ඨපෙත්වා අවසෙසං සබ්බම්පි සික්ඛාපදං සබ්බෙහි ලජ්ජීපුග්ගලෙහි අනතික්කමනීයත්තා වුත්තං සබ්බෙහිපි…පෙ…භාවතොති"යි සාරත්ථදීපනියෙහිද වණ්ණනාකළේය…පඤ්ඤත්තං සික්ඛාපදං, පණවාවදාළ ශික්ෂාපදය ; සබ්බෙහිපි ලජ්ජීපුග්ගලෙහි, සියළුම ලජ්ජී පුද්ගලයන් විසින් ; සමං සික්ඛිතබ්බභාවතො, සමගියෙන් හික්මියයුතු බැවින් ; සමසික්ඛතා නාම, සමසික්ඛතා නම් ; නහාපිතපුබ්බකානං, පෙර කරනැවැම්ව සිට පැවිදිවූ භික්ෂූන්ට ; ඔධිස පඤ්ඤත්තංවිය, ක්ෂුරභාණ්ඩය (දැලිපිහිය) පරිහර

ණය නොකටයුතුයයි පණවාවදාළ සිකපදයමෙන්;
ශඛිසානුඤ්ඤාතං, (අන්‍යභික්ෂූන්ට ක්ෂුරභාණ්ඩ පරි
හරණය යක්ෂාවිෂ්ටභික්ෂූන්ට කාලවිකාලදෙක්හි අමු
ල්මස්අනුභවයආදිවශයෙන්) වෙනවෙනම පණවා
වදාළ සිකපද; ඨපෙත්වා, තබා ; අවසෙසං සබ්බම්පි
සික්ඛාපදං, අවශෙෂ සියළුම ශික්ෂාපද ;
සබ්බෙහි ලජ්ජීපුග්ගලෙහි, සියලු ලජ්ජී පුද්ගල
යන් විසින් ; අනතික්කමනීයතො ; නොඉක්මවිය
යුතු හෙයින් ; සබ්බෙහි...පෙ...භාවතොති, භාව
නොයි ; වුත්තං, වදාරණලදී...මෙහි භාවය නම්
“කාලොධි දෙසොධි පුග්ගලොධි” වශයෙන් අනු
දැනවදාළ සිකපදහැර සෙසු සියළුම සිකපද
ලජ්ජී පුද්ගලයන් විසින් එක්ව සමගියෙන් පිළි
පැදියයුතු හෙයින් සමසික්ඛතා නම්වේ...

දඹදිව සමහරෙක් ලක්දිව සමහරෙක් දෙව්
ලොව සමහරෙක් වසත්මුත් “සහජීවන්ති එත්ථාති
සාජීවං” යනතන්හි කී සාජීවයමෙන් ශික්ෂා පදඅන
තික්‍රමණ භාවය සමාන හෙයින් සමයයි කියනු
ලැබේ. සිල්වත් අලජ්ජී පුද්ගලතෙම වදාළ
නාක් සියළු සිකපද පිළිනොපැද සමහරක් කඩ
කරණ හෙයින් සියළු සිකපදයන්හි සම
නොව සමහරක පමණක් සමවේ. කෙසේදයත්?
ශාඛාපලාස සිඳීගියත් ඒ සිඳීගිය සාඛාපලාසයන්ම
වියලීගොස් වෘක්ෂය නොනැසී පවත්නාක්මෙන්.
පාරාජිකාවූ දුශ්ශීල අලජ්ජීහු වනාහි මුල්සිඳුනු
වෘක්ෂය සර්වප්‍රකාරයෙන් වියලී නැසී යන්නාක්
මෙන් මෙනම් විනයකර්මය උපොසථකර්මය ශික්ෂා
පදය පිළිපැදියයුතුයයි කියා ඇති තැනැත්තෙක්
නොවේ. එසේ ශීලවන්ත අලජ්ජී දුශ්ශීලයන්
විසින් ඉක්මවා හැසිරෙණලද තමුත් යහපත්
ලජ්ජී භික්ෂූන් විසින් ව්‍යතික්‍රමණය නොකොට

පිළිපදිනාතෙක් සමසික්ඛතං නාමය නොසිඳ පවතීමය.

යළිඳු ශාසනාන්තර්ධානය ළංවීමෙන් ලජ්ජී භික්ෂූන් සහමුලින් සුත්වීගියත් අභ්‍යාපීඩෝද්‍යාතකතබ්බ ප්‍රත්‍යයෙන් කළ අර්ථකථා සංවර්ණනා පරිච්ඡෙදන් සිකපදයෙහිවූකලී හික්මියයුතුසවභාවයඇති හෙයින් සමසික්ඛතා නාමය නොබිඳේමය. විමති විනොදනී ටීකාචාර්‍ය්‍යයෝ "සමං" යන පදය අනුවගොස් භික්ෂුද්‍රව්‍යය එකතුකොට "එකතො වන්දන භුඤ්ජන ගාමප්පවිසන වත්තපටිවත්තකරණ උග්ගහ පරිපුච්ඡාසජ්ඣායකරණාදි සාමග්ගිකිරියාවසෙන පඤ්ඤත්තසික්ඛාපදසික්ඛනං සමසික්ඛතානාම තස්මාලජ්ජීහෙව සමං සික්ඛිතබ්බං න අලජ්ජීහිති දස්සෙතුං පඤ්ඤත්තං පන...පෙ...සමසික්ඛතා නාමාති වුත්තං" යනාදිවශයෙන් මංමුලාවූ පුරුෂයෙක් බටහිර නැගෙනහිරයයි ගෙණ ගමන් කළාක්මෙන් වූවමනානොවූ වචන මාලාවක් ඇතුල්කොට වර්ණනාකළෝය. එකතො වන්දන...පෙ...වසෙන, එකතුව වැඳීම එකතුව වැළඳීම වත්පිළිවෙත් කිරීම පාළි ඉගෙණීම අටුවා ඉගෙණීම එකතුව සජ්ඣායනා කරණාදී සාමාග්‍රී ක්‍රියාවශයෙන් පණවනලද ශික්ෂාපද ශික්ෂණය; සමසික්ඛතානාම, සමසික්ඛතා නම්වේ; තස්මා, ඒ ශික්ෂාපද ශික්ෂණයද; ලජ්ජීහෙව සමං, ලජ්ජීන් හා සමගම; සික්ඛිතබ්බං, හික්මියයුතු; අලජ්ජීහි සමං, අලජ්ජීන් හා සමග; නසික්ඛිතබ්බං, නො හික්මියයුතු; ඉති, මෙසේ දක්වන්ට; පඤ්ඤත්තං පන...පෙ...සමසික්ඛතා නාමාති, සික්ඛතා නාම යයි; වුත්තං, කියනලදී.

අටුවාවෙහි ශික්ෂාපදය සමසික්ඛතාකොටගෙණ කියනලදී. විමති විනොදනී ටීකාවෙන්

නික්මීම කියනලදී—එහෙයින් අනුසන්ධියෙහි දීම වරද. අනුසන්ධිය ලියුබැව් පෙණේ—මේ විමති වාක්‍යයෙහි එකතොවන්දනය අලජ්ජීන් සමග චෛත්‍ය බොධි ආදිය වන්දනාවයයි ගතහොත් ඇවැත් සිදුවන්ට ශික්ෂාපදයක් නැත—ඉදින් වෘද්ධ පිළිවෙලින් කටයුතුවූ නවකභික්ෂූන්ගේ වන්දනාව යයි ගතහොත්

උක්ඛිත්තානුපසම්පන්නා
නානාසංවාස ඉත්ථියො
නවොච ගරුකඨාච
පණ්ඩකොච අවන්දියා.(ඛුද්දසික්ඛා)

උක්ඛිත්තකා, ඇවත නොදක්ම ඇවතට පිළියම් නොකිරීම ලාමක දෘෂ්ටිය නොහැරීම නිමිත්ත කොටගෙණ උක්කෙඛපනීයකම් ලද පුද්ගලයාද ; අනුපසම්පන්නා, අනුපසම්පන්නයාද ; නානාසංවාසඉත්ථියො, ලබ්ධිනානා සංවාසක අධර්මවාදී භික්ෂූය මාගම යන මොව්හුද ; නවොච, තමහට උපසම්පදාවෙන් ළදරු නවකභික්ෂූවද ; ගරුකඨාච, පාරිවාසික මූලාය පටිකස්සනාරහ මානත්තාරහ මානත්තචාරික අබ්භානාරහ යන සඟවසෙස් ගරු ඇවැත් අවත්පත් මහණුන්ද ; පණ්ඩකොච, පණ්ඩකද යන මොව්හු ; අවන්දියා, නොවැඳියයුත්තෝයි— මෙසේ ආ එකොළොස්දෙනා හා නග්නභික්ෂුවය යන ආපත්තිජනක අවන්දිය පුද්ගලයන් දොළොස්දෙනා කෙරෙහි තබා

වජංමගෙය වජංගාමං
අසම්භකාභරං කථා
අන්ධකාරගතො සුතෙතා
සාගුපායී භත්ත ගනිතො..

සපත්තො අඤ්ඤවිහිතො
ඛාදකො භුඤ්ජකො තථා
වච්චපස්සාව කම්මිනි
තෙලසෙතෙ අවන්දියා

යන අනාපත්තිජනක අවන්දිය පුද්ගලයන් තෙළෙස්දෙනා කෙරෙහි පවා අලජ්ජී භික්ෂුව ඇතුළත්වී නැත්තේය—"ඔතමසිකොති අන්ධකාරගතො අසම්මන්නාහරන්තොති කිච්චප්පසුතත්තා වන්දනං අසම්මන්නාහරන්තො එකාවත්තොති එකතො ආවත්තො සපත්තපක්ඛිකො වෙරී විසභාගපුග්ගලො වුච්චති අඤ්ඤවිහිතොති අඤ්ඤං චින්තයමානො උක්ඛිත්තකොති තිවිධෙන උක්ඛෙපනීයකම්මෙන උක්ඛිත්තකො අවන්දියොති තජ්ජනීයාදි කම්මකතාපන චත්තාරො වන්දිතබ්බා. උ පො ස ථ ප වා ර ණා සී තෙහි සද්ධිං ලබ්භන්ති ඉති ඉමෙසු පඤ්චකෙසු තෙරසන්නං වන්දන්තස්ස අනාපත්ති චාදසන්නං වන්දනාය ආපත්ති" (පරිවාර අට්ඨකථා උපාලි පඤ්චක වණ්ණනා)—ඔතමසිකොති, ඔතමසිකො යනු ; අන්ධකාරගතො, අන්ධකාරගත භික්ෂුය ; අසම්මන්නාහරන්තොති, අසම්මන්නාහරන්ත යනු ; කිච්චප්පසුතත්තා, කෘත්‍යයෙක්හි ව්‍යාවෘතවූ හෙයින් ; වන්දනං, වන්දනාව; අසම්මන්නාහරන්තො, මෙනෙහි නොකරන භික්ෂුවයි; එකාවත්තොති, එකාවත්තො යනු : එකතො, එක් පාර්ශවයකට ; ආවත්තො, ආවතීකවූ; සපත්තපක්ඛ, ශත්‍රුපක්ෂයෙහි; ඨිතො, සිටියාවූ ; වෙරී, වෛරීවූ ; විසභාගපුග්ගලො, විසභාගපුද්ගලයා ; වුච්චති, කියනුලැබේ ; අඤ්ඤවිහිතොති, අඤ්ඤවිහිතො යනු ; අඤ්ඤං, අනික් අරමුණක් ; චින්තයමානො, සිතමින් හුන් පුද්ගලයාය ; උක්ඛිත්තකොති; උක්ඛිත්තකයනු; තිවිධෙන උක්ඛෙපනීයකම්මෙන, ත්‍රිවිධ උත්ක්ෂෙපනීය කර්මයෙන් ; උක්ඛිත්තකො, උත්ක්ෂිප්තක භික්ෂුව ; අවන්දියො, නොවැඳියයුත්තේය ; තජ්ජනීයාදි කම්ම

කතා, තජ්ජනීයාදි කම් කරණුලැබුවාවූ ; වත්තාරොපන, සතරදෙන වතාහි , වන්දිතබ්බා, වැඳිය යුත්තෝයි ; උපොසථපවාරණාපි, පොහෝපවුරුණුද ; තෙහිසද්ධිං, ඔවුන් හා සමග ; ලභන්ති, ලැබෙත් ; ඉතිඉමෙසු පඤ්චකෙසු, මෙසේ මේ පඤ්චකයන්හි ; තෙරසජනෙ, තෙළෙස්දෙනෙක් ; වන්දන්තස්ස, වඳින භික්ෂුහට ; අනාපත්ති, ඇවත් නොවේ ; ද්වාදසන්නං, දොළොස්දෙනාකුන්ට ; වන්දනාය, වැඳීමෙන් ; ආපත්ති, ඇවත්වේ —

සාමාන්‍ය අලජ්ජීයා තබා පාරාජිකාවූදුශ්ශීල අලජ්ජීයාට පවා වැඳීමෙන් ඇවතක් සිදුනොවන බව “එත්ථ අස්සමණොසීති අවන්දනකාරණස්ස වුත්තත්තා අන්තිමවත්ථුං අජ්ඣාපන්නො නවන්දිතබ්බොති වදන්ති තං නගහෙතබ්බං අවන්දියෙසු අන්තිමවත්ථුං අජ්ඣාපන්නස්ස අවුත්තත්තා පච්ඡා උපසම්පන්නෙනාපි පුරෙඋපසම්පන්නො වන්දිතබ්බොති වුත්තත්තාච ඉදංපන අත්ථතො වත්තබ්බං දස්සෙතුං වුත්තං” (කඞ්ඛාවිතරණී දුට්ඨදොස සික්ඛාපද වණ්ණනාටීකා)—එත්ථ මේ සාමීචි ප්‍රතික්ෂෙප චොදනායෙහිද ; අස්සමණො, අශ්‍රමණයෙක් ; අසි, වූයෙහි ; ඉති, මෙසේ ; අවන්දනකාරණස්ස, නොවැඳීමට කාරණය ; වුත්තත්තා, චොදකයා විසින් කියනුලැබූහෙයින් ; අන්තිමවත්ථුං, පාරාජිකාවස්තුවට ; අජ්ඣාපන්නො, පැමිණි භික්ෂුතෙම ; නවන්දිතබ්බොති, නොවැඳුයුතුයයි ; වදන්ති, සමහරු කියත් ; තං, ඒ කීම ; නගහෙතබ්බං, නොගතයුතු ; අවන්දියෙසු, පස්විසි අවන්දිය පුද්ගලයන් කෙරෙහි ; අන්තිමවත්ථුං, අන්තිම වස්තුවට ; අජ්ඣාපන්නස්ස, පැමිණි පුද්ගලයා ; අවුත්තත්තාච, නොවදාරණලැබූ හෙයින්ද ; පච්ඡා උපසම්පන්නෙන, පසුව උපසපන්වූ භික්ෂුවිසින්; පුරෙ උප

සම්පන්නො, පූජියෙහි උපසම්පන්වූ භික්ෂුව ; වන්දි
තබ්බාති, වැඳියයුත්තේයයි ; වුත්තත්තාව, වදාළ
හෙයින්ද යන විවිධ කාරණයෙනි ; පනතථාපි,
එසේ වැඳියයුතු නමුත් ; අත්තනා, තමා විසින් ;
වත්තබ්බං, කියයුතුවචනය; දස්සෙතුං, දක්වන්ට;
ඉදං, මේ අස්සමණෝයනාදිය; වුත්තං, කියනලදි—

මධ්‍ය මණ්ඩලයෙහි පටන් ලංකාද්වීපයෙහි මේ
දක්වා පැවතෙන මහණුන්තුළ එක් බඳුනෙක
එකට වළඳන සිරිතක්. නොමැති හෙයින් විමති
විනොදනී ටීකාවෙහි "එකතොබ්‍යඤ්ජන" යයි කී
වචනයෙන් ගතයුතු ප්‍රයෝජනයක් නොපෙණේ—
බුරුම භික්ෂූන් මෙන් එක ව්‍යඤ්ජන බඳේසියෙක්
හි වළඳන්මුත් දයකයන්සතු ව්‍යඤ්ජන නම් දෙන
මක් එකවර අනාදමානොගෙණ වළඳන් නම් ඒ
භික්ෂූන්ට ඇවත් සිදුවියහැකි ශික්ෂාපදයක් නැත්
තේය—හුදෙක් අලජ්ජීන්සතු පසයගෙණ පරිභො
ගකරණ භික්ෂූන්ටම ආමිසසම්භොගයවත්තෝය—
එහෙයින් ලජ්ජී ලජ්ජීන් සමග කරණ පරිභොගය
සඳහාම "ලජ්ජිනො ලජ්ජිනාසද්ධිං පරිභොගො
විය ද්වින්නං ඛත්තියකුමාරානං සුවණ්ණපාතියං භොජ
නාදිසො" යි රූපිය ශික්ෂාපද වණ්ණනා අට්ඨ
කථායෙහි උපමාකර කියනලදි—ලජ්ජිනො, ලජ්ජි
යාගේ; ලජ්ජිනාසද්ධිං, ලජ්ජියා සමග ; පරිභො
ගො, එක් නමක්සතු පසය එක් නමක් ගෙණ
පරිභොගය : ද්වින්නං ඛත්තියකුමාරානං, ක්ෂත්‍රි
කුමරුන් දෙදෙනෙකුගේ ; සුවණ්ණපාතියං, රන්
පයෙක්හි ; භොජනාදිසො, අනුභව කිරීම හා
සදෘශයි ; "එකතො ගාමප්පවිසන" කීතත්හිද
පස්සෙන් ආවාවූ පණ්ඩරඞ්ග පරිබ්‍රාජිකාවන් සමග
එකට ගම්වැදුනත් ඇවැත් නොවේ—

ඉදිරියෙන් හෝ පස්සෙන් යන අලජ්ජි භික්ෂූ
නොවිචාරා ගම්වදින භික්ෂුවට්ම ඇවැත් සිදුවේද

...ස පවාරා එකටවූවත් ඇතුල්වන භික්ෂුවට ඇවැත්
සිදුවේයයි වදාළ ශික්ෂාපදයක් නැත්තේය—"එක
තො වත්තපටිවත්තකරණ" යයි කීතත්හි ආචාර්ය
උපාධ්‍යාය වත්පිළිවෙත් සේනාසන වත්පිළිවෙත්
ආදිය අලජ්ජීන් සමග එකට කිරීමෙන් ඇවත් සිදු
වන ශික්ෂාපදයක් නැත—භුදෙක් අලජ්ජීන්ගේ
හස්තකර්මාන්තයෙන් උපන් පිරිකර පරිභොගක
රණ ආචාර්යයාහට ඇවත් වෙනොත් වියහැකිය—
"එකතො උග්ගහ පරිපුච්ඡාසජ්ඣායකරණ" යයි කී
තාන්හි ස්ත්‍රී පුරුෂ පණ්ඩරඞග පරිව්‍රාජිකාවන් සමග
පොතපත කියවාගැණීම් පිරිත්කීම් ආදිය එකට
කළත් ඇවත් සිදුවන්ට ශික්ෂාපදයක් නැත—කිය
වන ආචාර්ය භික්ෂුවටම පදසො ධම්ම උත්තරි
ඡප්පඤ්චවාචා ධර්මදෙශනා ශික්ෂාපදයෙන් ඇවත්
සිදුවෙතොත් සිදුවියහැකිය—

අලජ්ජීයා සමග පොතපත කියවාගැණීම්
පිරිත්කිම් ආදිය කරන්නවුන්ට කවරනම් ශික්ෂා
පදයකින් ඇවත් සිදුවන්නේද නොවන්නේමය—
එහෙයින් අලජ්ජීපග්ගහ සිතින් ඒ අලජ්ජීයාගේ
සිර්නිරාවය පැතිරීම පිණිස එකට ඉගෙණගන්නා
වූ භික්ෂූන්ගේ ඉගෙණීමම ධර්ම සම්භොගයයි අර්ථ
කථායෙහි කියනලදී—

එපමණක්ද නොවේ, "ධම්ම පරිභොග ආමිස
පරිභොගෙසු පන යස්ස ආමිසපරිභොගො වට්ටති
තස්ස ධම්ම පරිභොගොපි වට්ටති" (රූපිය ශික්ෂාපද
අර්ථකථා)--ධම්ම පරිභොග ආමිස පරිභොගෙසු
පන, ධර්ම පරිභොග ආමිෂ පරිභොගයන් අතු
රෙන් වනාහි ; යස්ස, යම්තැනෙක්හි ; ආමිසපරි
භොගො, ආමිෂ පරිභොගය ; වට්ටති, වටීනම් ;
තස්ස, එතැන්හි ; ධම්ම පරිභොගොපි, ධර්ම පරිභො
ගයද; වට්ටති, වටී—මෙහි භාවය නම් ආමිෂ පරි

**භොගයවක් ධම්මිය අධම්මිය පරිභොග චතුෂ්ක** යෙහි දක්වූපරිද්දෙන් ලජ්ජිපුද්ගලයාගේ ධාර්මික ආමිෂයමගෙණ පරිභොගකටයුතුය—ධර්මය වනාහි **සිල්වත් අලජ්ජියාගෙන් නොව පාරාජිකාවූ දුශ්ශීල අලජ්ජියාගෙන් පවා ධර්මානුග්‍රහ චිත්තයෙන් ඉගෙණියයුත්තේය—**

**මෙහි ධර්මානුග්‍රහය නම් අලජ්ජියාගේ කීර්ති රාවය පැතනැගී ලාභියෙක්වීම සඳහායයි අලජ්ජි** ප්‍රග්‍රහසිත නුපදවා තමන් ඉගෙණගත් ධර්මය ලෝකයා අතර පතළවේවායි උපදවාගත් ඡන්දය ධර්මානුග්‍රහයවේ—එසේ ධර්මානුග්‍රහ චිත්තයෙන් බණදහම් ඉගෙණීම නම් වරී—දුශ්ශීලයා සමග ආමිෂ පරිභොගයවූකල් සර්වප්‍රකාරයෙන්ම නො වරී—එහෙයින් ධර්ම පරිභොගයට වඩා ආමිෂ පරිභොගය බැරෑරුම් එකක් බව දතයුතු—දුරින්ම දුරුවී විසියයුතු පරිභොගයකි—එහෙයින් අර්ථකථාචාර්යයෝ ඒ අර්ථය දක්වනු පිණිස "යොපන කොපියං සීඝතොගණෙඪා" යනාදිවශයෙන් විනීය වාක්‍යය කීහ—විමතිවිනොදනී ටීකාචාර්යයෝ වනාහි "ධම්මපරිභොගොපි තත්‍ථ වට්ටතීති ඉමිනා ආමිස පරිභොගතො ධම්ම පරිභොගොව ගරුකො තස්මා අතිවිය අලජ්ජිවෙකෙන කාතබ්බොති දස්සෙති" යනුවෙන් කැත්ත අක්මුල් මාරුකොට මිට සවිකළාක්මෙන් පරස්පර විපර්යාස වශයෙන් වර්ණනාකළෝය—

අලජ්ජීන්කෙරේ ඔබ වෛරයෙන් සිහි විකාලත්ව කලවර්ණනාවක්මෙනි—"තත්‍ථ ධම්මපරිභොගොපි වට්ටතීති ඉමිනා" වට්ටති යන මේ පාඨයෙන් ; ආමිස පරිභොගතො, ආමිෂ පරිභොගයට වඩා ; ධම්ම පරිභොගොව, ධර්ම පරිභොගයම ; ගරුකො, ගරුකය ; තස්මා, එහෙයින් ; අතිවිය,

ාඩීයක්ම ; අලජ්ජීවිවෙකෙන, අලජ්ජි විවෙක
යෙන් හෙවත් අලජ්ජීන්ගෙන් වෙන්වීමෙන් ; කා
තබ්බාඉති, කටයුත්තේයයි ; දසෙසති, දක්වයි—
ඇවත්වූකලී බුඩභාෂිත පාලියෙහි හෝ බුඩමතඥ
වූ රහතන් විසින් සංගායනාකල අඨකථායෙහි
හෝ දක්නාලද්දක්ම ගතයුතුයි—

පශ්චිම පණ්ඩිත ටීකානුටීකාචාර්ය්‍යයන් විසින්
ඇවත් නොපැණවියහැකිය—අළුත් පැණවිලි ඉපිද
වීම සාපරාධයෙකි—එහෙයින් භාග්‍යවතුන්වහන්
සේ “සාධුසාධු උපසෙන අපඤ්ඤත්තං න පඤ්ඤපි
තබ්බං පඤ්ඤත්තංවා න සමුච්ඡින්දිතබ්බං යථා
පඤ්ඤත්තෙසු සික්ඛාපදෙසු සමාදාය වත්තිතබ්බං”
යි වදාළේය—උපසෙන, උපසෙනය ; සාධු සාධු,
තාගේ වදන් යහපති යහපති ; අපඤ්ඤත්තං, මා
විසින් නොපණවනලද්දක් ; න පඤ්ඤපිතබ්බං,
ශ්‍රාවකයන් විසින් නොපැණවියයුතු ; පඤ්ඤත්තං
වා, මා විසින් පණවනලද්දක් හෝ ; න සමුච්ඡින්දි
තබ්බං, නොඋදුලියුතු ; යථාපඤ්ඤත්තෙසු, මා
විසින් පණවනලද පරිදිවූ ; සික්ඛාපදෙසු, ශික්ෂා
පදයන්හි නොහොත් ශික්ෂාපදයන් ; සමාදාය,
මොනවට සමාදන්ව ; වත්තිතබ්බං, පිළිපැදිය
යුතුයි—

විමතිවිනොදනී ආචාර්ය්‍යයන් විසින් ලෙශ
මාත්‍රවශයෙන් වැරදියයි වැටහුණු සියල්ලක්ගෙණ
මුනොවුන්තුල වාදවිවාද උපදවාලීම පිණිස
ඇවත් නියමකරමින් අළුත් පැණවිලි රැසක්ම
උපදවා තිබේ—අසංවාස අදින්නාදානපාද සම්
භොග උදකුක්ඛෙප යනාදී ස්ථානයන්හි විමති
විනොදනී ටීකාචාර්ය්‍යයන්මෙන් සමහර පැණවත්තු
ගිහින් විසින් රක්ෂාකටයුතු පන්සිල් අටසිල් දස
සිල් යන ශීලමය කුශලයන්හිද දන අපචායන

වෛයාවෘච්ච පත්තිදාන පත්තානුමෝදනා ධර්මශ්‍රවණ ධර්මදේශනාමය කුශලයන්හිද මෛත්‍රී ආදී භාවනාමය කුශලයන්හිද මාර්ගාඞ්ගකර්මය දුර්වලව චේතනා කර්මය බලවත්වූ හෙයින් ඒ චේතනා කර්මයෙන් කාමරූපාදි ප්‍රතිසන්ධි විපාකමුත් චතුර්විධ ශ්‍රාමණ්‍ය ඵල සංඛ්‍යාත ලෝකෝත්තර විපාක ගෙණදීමක් නැත්තේය—

ඒහෙයින් ඒ චේතනා කර්මය භවය දික්වීමටම හේතුවේයයි කියති—මෙසේ නලතුනා උගත්තු යම් යම් ධර්ම විනිශ්චයක් හෝ විනය විනිශ්චයක් හෝ වරදවාගෙණ විනිශ්චය කරත්නම් එයින් නුවණමද පශ්චිම ජනතාව නොමග යාමෙන් නෛර්යාණික සර්වඥ ශාසනය අවුල් කරගැනීමෙන් බොහෝ සත්වයන්ට අනර්ථයක් අහිතයක්ම වියහැක්කේය—

ඒ හෙයින් ඒ තලතුණා පෑණවත්හු "අත්තනා දුග්ගහිතෙන අමෙහචෙව අබ්භාචික්ඛති අත්තානඤ්ච ඛණති බහුඤ්ච අපුඤ්ඤං පසවති" යි වදාළිලෙස නොවීම පිණිස බොහෝකොට යෝනිසෝමනසිකාරය හා සමෘති සම්ප්‍රජන්‍යයක් ඇති කරගතයුත්තේමය—රූපිය ශික්ෂාපදවර්ණනායෙහි "චත්තාරො පරිභොගා ලජ්ජිපරිභොගො අලජ්ජිපරිභොගො ධම්මිය පරිභොගො අධම්මිය පරිභොගොති තත්‍ථ අලජ්ජිනො ලජ්ජිනාසද්ධිං පරිභොගො වට්ටති ආපත්තියා නකාරෙතබ්බො අලජ්ජිනො අලජ්ජිනා සද්ධිං යාවනජානාති තාව වට්ටති ආදිතො පට්ඨායහි අලජ්ජිනාම නත්‍ථි අලජ්ජිනො පන අලජ්ජිනාවසද්ධිං පරිභොගෙ ආපත්ති නාම නත්‍ථි ලජ්ජිනො ලජ්ජිනාසද්ධිං පරිභොගොම්හාකං ඛත්තියකුමාරානං සුවණ්ණපාතියං භොජන සදිසො ධම්මියා ධම්මිය පරිභොගො පච්චයවසෙන

වෙදිතබ්බා තත්‍ථ සචෙ පුග්ගලොපි අලජ්ජී පිණ්ඩ
පාතොපි අධම්මියො උභොපෙජිගුච්ඡා පුග්ගලො
අලජ්ජීපිණ්ඩපාතො ධම්මියො පුග්ගලං ජිගුච්ඡිතබ්බො
පිණ්ඩපාතො නගහෙතබ්බො පුග්ගලො ලජ්ජී
පිණ්ඩපාතො අධම්මියො පිණ්ඩපාතො ජිගුච්ඡො
නගහෙතබ්බො පුග්ගලො ලජ්ජී පිණ්ඩපාතොපි
ධම්මියො වට්ටති, අපරෙ චෙපග්ගහා චෙව පරිභො
ගා ලජ්ජීපග්ගහො අලජ්ජීපග්ගහො ධම්මපරිභො
ගො ආමිසපරිභොගොති තත්‍ථ අලජ්ජීනා ලජ්ජිං
පග්ගහෙතුං වට්ටති නසො ආපත්තියා කාරෙ
තබ්බො සචෙපන ලජ්ජී අලජ්ජිං පග්ගණ්හාති
අනුමොදනාය අජ්ඣෙසති ධම්මකථාය අජ්ඣෙසති
කුලෙසුඋපත්‍ථම්භති ඉතරොපි අම්හාකං ආචරියො
ඊදිසොච ඊදිසොචාති තස්සපරිසති වණ්ණංභාසති
අයං සාසනං,ඔසක්කාපෙති අන්තරධාපෙතීති වෙදි
තබ්බො,ධම්මපරිභොගආමිසපරිභොගෙසුපනයත්‍ථ
ආමිස පරිභොගො වට්ටති තත්‍ථ ධම්ම පරිභොගො
පි වට්ටති යොපන කොට්ඨසං සීතො ගන්‍ථො තස්ස
පුග්ගලස්ස අච්චයෙන නස්සිස්සති තං ධම්මානුග්
ගහෙන උග්ගණ්හිතුං වට්ටතීති වුත්තං තත්‍රිදං
වචු (අර්ථකථා)—පරිභොගා, පරිභොගයෝ ; ලජ්ජී
පරිභොගො, ලජ්ජීන් සමග පරිභොග කිරීමද ;
අලජ්ජී පරිභොගො, අලජ්ජීන් සමග පරිභොග
කිරීමද ; ධම්මිය පරිභොගො, ධර්මයෙන්ලද ප්‍රත්‍ය
ය පරිභොගයද ; අධම්මිය පරිභොගො ඉති, අධර්
මයෙන්ලද ප්‍රත්‍යය පරිභොගයදැයි ; චත්තාරො,
සතරදෙනෙක් වෙති ; තත්‍ථ, ඒ සතර අතුරෙන් ;
අලජ්ජිනො : අලජ්ජියාගේ ; ලජ්ජිනාසද්ධිං, ලජ්ජි
යා සමග ; පරිභොගො, පරිභොගය ; වට්ටති,
වේ ; සො, ඒ අලජ්ජී පුද්ගලතෙම ; ආපත්තියා,
ආපත්තියෙන් ; නකාරෙතබ්බො, විනිශ්චය නො
කටයුත්තේය ; ලජ්ජිනො, ලජ්ජියාගේ ; අලජ්ජී

නා සද්ධිං, අලජ්ජීයා සමග ; පරිභොගො, පරිභො-
ගය ; යාවනජානාති, යම්තාක්කල් අලජ්ජීබව
නොදනීද ; තාව, ඒතාක්කල් ; වට්ටති, වටී ; ('ති'
යනු දල්හිකරණද්‍යොතකයි) ආදිතොපඨාය, මුල
පටන් (හෙවත් උපසපන්වූතැන් පටන්) අලජ්ජී
නාම, අලජ්ජියෙක් නම් ; නත්ථි, නැත ; අලජ්ජී
නොපන, අලජ්ජියාගේ වනාහි ; අලජ්ජිනාවසද්ධිං,
අලජ්ජියෙක් සමගම ; පරිභොගෙ, පරිභොගයකිරීම
නිමිත්තකොට ; ආපත්තිනාම, ඇවතක්නම් ; නත්ථි,
නැත ; (දෙවෙනිවාක්‍යයටඅර්ථයට ලියනලද්දේය)
ධම්මියා ධම්මිය පරිභොගො, දැහැමි නොදැහැමි
පරිභොගය ; පච්චයවසෙන, ප්‍රත්‍යය වශයෙන් ;
වෙදිතබ්බො, දතයුත්තේය ; තත්‍ර, ඒ ද්විප්‍රකාර
පරිභොගයන් අතුරෙන් ; පුග්ගලොපි, පුද්ගල
තෙමේද ; සචෙ අලජ්ජී, ඉදින් අලජ්ජියෙක්නම් ;
පිණ්ඩපාතොපි, පිණ්ඩපාතයද ; සචෙ අධම්මියො,
ඉදින් අධර්මයෙන්ලද පිණ්ඩපාතයක් වීනම් ;
උභො, පිණ්ඩපාත පුද්ගලදෙකොටසම ; ජෙගුච්ඡා,
පිළිකුල් කළයුත්තාහුය ; පුග්ගලො, පුද්ගලතෙම ;
සචෙ අලජ්ජී, ඉදින් අලජ්ජියෙක් වීනම් ; පිණ්ඩ
පාතො, පිණ්ඩපාතය ; සචෙ ධම්මියො, ඉදින් ධර්ම
යෙන්ලද පිණ්ඩපාතයක් නම් ; පුග්ගලං, පුද්ගල
යා ; ජිගුච්ඡිත්වා, පිළිකුල්කොට ; පිණ්ඩපාතො,
පිණ්ඩපාතය ; නගහෙතබ්බො, නොගතයුත්තේය ;
පුග්ගලො, පුද්ගලතෙම ; සචෙ ලජ්ජී ; ඉදින්
ලජ්ජියෙක්නම් ; පිණ්ඩපාතො, පිණ්ඩපාතයතෙම ;
සචෙ අධම්මියො, ඉදින් අධර්මයෙන්ලද පිණ්ඩපා
තයක් නම් , පිණ්ඩපාතො, පිණ්ඩපාතයතෙම ;
ජිගුච්ඡො, පිළිකුල්කළයුත්තේය ; නගහෙතබ්බො,
පිළිනොගතයුත්තේය ; පුග්ගලො, පුද්ගලතෙම ;
සචෙ ලජ්ජී, ඉදින් ලජ්ජියෙක් නම් ; පිණ්ඩපා
තොපි, පිණ්ඩපාතය තෙමේද ; සචෙ ධම්මියො,

ඉදින් ධර්මයෙන්ලද පිණ්ඩයක්නම් ; වට්ටති, වටී ; අපරෙ, අනිකුදු ; පග්ගහා, ප්‍රග්‍රහණයෝ ; වෙ, දෙදෙනෙක්වෙති ; පරිභොගාච, පරිභොගයෝද ; වෙ, දෙදෙනෙක් වෙති ; ලජ්ජිපග්ගහො, ලජ්ජිප්‍රග්‍රහයද ; අලජ්ජිපග්ගහො, අලජ්ජි ප්‍රග්‍රහයද; ධම්ම පරිභොගො, පර්‍ය්‍යාප්තිධර්ම්ය ඉගෙණීම්වශයෙන් පරිභොගයද; ආමිස පරිභොගො, ආමිෂ ප්‍රත්‍යයගෙණකරණ පරිභොගයදැයි; ඉති ඉමෙ, යන මේ විවිධ පරිභොගයෝයි—තත්‍ර, ඒදුක සතර අතුරෙන් ; අලජ්ජිනා, අලජ්ජියා විසින් ; ලජ්ජිං, ලජ්ජියා ; පග්ගහෙතුං, ප්‍රග්‍රහණය කරන්ට ; වට්ටති, වටී ; සො, ඒ අලජ්ජියා ; ආපත්තියා, ආපත්තියෙන්, නකාරෙතබ්බො, විනිශ්චය නොකටයුත්තේය ; ලජ්ජී, ලජ්ජිතෙම ; අලජ්ජිං, අලජ්ජියාට ; සචෙපන පග්ගණ්හාති, ඉදින් ප්‍රග්‍රහණයකෙරේ නම් ; අනුමොදනාය, දානානිසංසයෙන් තුටුකරවනු පිණිස දෙශනාකරණ අනුමොදනා කථායෙහි ; සචෙ අජ්ඣෙසති, ඉදින් ආරාධනා කෙරේනම් ; ධම්ම කථාය, ධර්ම ස්වභාව ප්‍රකාශවන ධර්ම කථායෙහි , සචෙ අජ්ඣෙසති, ඉදින් ආරාධනා කෙරේනම් ; කුලෙසු, දායක කුලයන්හි ; සචෙ උපත්ථම්භෙති ; කීර්තිය පැනනැගීම පිණිස ඉදින් අනුබලදී උපස්තම්භනවේනම් ; ඉතරොපි, මේ අනුබලදුන් ලජ්ජියාකෙරෙන් අන්‍යවූ යට වාක්‍යයෙහි දැක්වූ උපස්ථම්භිත ලජ්ජි පුද්ගලතෙමේද (මේ පදය අලජ්ජියා ආකර්ෂණයකොට අර්ථ කියන්ට පුළුවන. සිහි එලවනු) අම්හාකං, අපගේ ; ආචරියො, ආචාර්‍ය්‍යතෙම ; ඊදිසොච, මෙසේත් ගුණවතෙකි ; ඊදිසොච, මෙසේත් ගුණවතෙකි ; ඉති, මෙසේ ; තස්ස, ඒ තමහට අනුබලදුන් අලජ්ජියාගේ ; වණ්ණං, ගුණ ; පරිසති, තෙමේ දහම් දෙසන පිරිස්හි ; භාසති, කියාද ; අයං, මේ උපස්ථම්භිත උපස්ථම්භි

ගක පුද්ගලතෙම ; සාසනං, සාසනය ; ඔසක්කා
පෙති, පසුබස්වයි ; අන්තරධාපෙති ඉති, අතුරු
දන් කෙරේයයි ; වෙදිතබ්බා, දතයුත්තේය ;
ධම්මපරිභොග ආමිසපරිභොගෙසු පන, ධර්ම පරි
භොග ආමිෂ පරිභොගයන් අතුරෙන් වනාහි ;
යත්‍ර, යම්තැනෙක්හි ; ආමිසපරිභොගො, ආමිෂ
පරිභොගය ; වට්ටති, වේද ; තත්‍ර, එයි ; ධම්ම
පරිභොගොපි, ධර්ම පරිභොගයද ; වට්ටති, වේ ;
කොටියං, කෙළවර ; ඨිතො, පිහිටියාවූ ; යොපන
ගන්ථො, යම් ග්‍රන්ථයක් වනාහි ; තස්ස පුග්ගලස්ස ;
ඒ ග්‍රන්ථධාරී පුද්ගලයාගේ ; අච්චයෙන, ඇවෑමෙන් ;
නාසිස්සති, නැතිවන්නේද ; තං, ඒ ග්‍රන්ථය ;
ධම්මානුග්ගහෙන, ධර්මානුග්‍රහයෙන් ; උග්ගණ්හිතුං,
ඉගෙණගන්ට ; වට්ටතීති, වේයයි ; වුත්තං, මහා
අට්ඨකථායෙහි කියනලදී ; තත්‍ර, ඒ ඉගෙණීයයුතු
ස්ථානයෙහි ; ඉදං, මේ මතු දක්වනු ලබන්නේ ;
වත්ථු, සාධක වස්තුවයි—

බ්‍රාහ්මණතිස්ස දුර්භික්ෂභයාගේ කාලයෙහි
බිරින්ද හා එකටහුන්නාවූ මහණෙක් සම්පයෙහි
චාතුනිකායික තිස්ස ස්ථවිරයන්ගේ උපාධ්‍යායවූ
මහා ත්‍රිපිටක ස්ථවිරයන් හා සමග මහා රක්ඛිත
ස්ථවිරතෙම මහා නිද්දෙසපාළිය ඉගෙණගත් වස්තු
වයි—"කෙවලං පග්ගණ්හිතුකාමතාය එවං කාතුං
නවට්ටති ධම්මස්සපන සාසනස්සසොතුනංච අනුග්ග
හත්ථාය වට්ටතීති වෙදිතබ්බං" (සාරාර්ථ දීපනී ටීකා)
කෙවලං පග්ගණ්හිතුකාමතාය, හුදෙක් අලජ්ජී
යාට ප්‍රග්‍රහකරණු කැමති භාවයෙන්ම ; එවං,
මෙසේ දූතානිසංසයෙන් සතුටුකරවන්නාට දෙශ
නාකරණ අනුමෙවෙති පිණිස ආරාධනා කිරීම්
ආදිය ; කාතුං, කරන්ට ; නවට්ටති, නොවේ ;
('පන' යනු අන්වයවිශෙෂද්‍යොතකයි) ධම්මස්ස,

ධර්මයටද; සාසනස්ස, ශාසනයටද; සොතූනඤ්ච, බණ අසන්නවුන්ටද; අනුග්ගහත්ථාය, අනුග්‍රහ පිණිස; වාචෙති, වදී; ඉති, මෙසේ ; වෙදිතබ්බං; දතයුතු—

මෙසේ ආ පරිභොග සතර අතුරෙන් අලජ්ජි පරිභොගයෙන් හා අධර්මිය පරිභොගයෙන් වැළකියයුතු—උපසම්පදා සීමාසම්මුති ආදී කටයුත්තක් ඇතිවූවිට අලජ්ජීන්ගේ විහාරාරාමවලට පැමිණ ඒ සෙනසුන්වල හිඳීම කොට්ටමෙට්ට ඇඳ ඇතිරිලි පරිභොගය වර්ජනමුත් දානවස්තු පිළිගැන්ම නොවටීමය. ගෘහස්ථයන්ට අයත් මණ්ඩපයකට හෝ ගෙදරකට නම් එහි පැමිණ තෙමේ සංඝස්ථවිර කෙනෙක්ව දහම් දෙසීමේ පොහොසත් නම් දහම් දෙසියයුතුය. එසේ දහම් දෙසීමෙහි අපොහොසත් නම් ප්‍රග්‍රහවය අතුරෙන් අලජ්ජී ප්‍රග්‍රහසිත නුපදවා දායකාදීන්ට ධර්ම ලාභය වේවායි මෙනෙහි කොට දහම් දෙසීම පිණිස ආරාධනා කට යුතුයි—තමසතු විහාරාරාමයෙහි කියනලද පරිදි උපසම්පදා සීමාසම්මුති ආදී සමක් ඇතිවූ විට එනාහි ඉඳුම්හිටුම් ආදි ඉරියව් දකීවායි පිළිසඳර කථා පවත්වා ඔහුතුළ ඊර්ෂ්‍යාමාත්සර්‍යාදී අකුසල් තුනීවේවා සනාදී වශයෙන් මෛත්‍රී කරුණාගුණ පෙරටුකොටගෙණ ආරාධනා කිරීමට අවකාශ තිබේනම් එසේ ආරාධනාකර වැඩමවා ගතයුතු—ඉදින් දායකයන් විසින්ම ආරාධනා කරණු ලැබේනම් ඒනැණද ඊර්ෂ්‍යාව නුපදවා සන්තෝෂය ඇතිකරගතයුතුය.

අලජ්ජීයායයි ව්‍යවහාර කරණලදුයේ කෙබන්දෙක්දයත්? "සඤ්චිච්ච ආපත්තිං ආපජ්ජති ආපත්තිං පරිගූහති අගතිගමනඤ්ච ගච්ඡති එදිසො වුච්චති අලජ්ජී පුග්ගලො"—සඤ්චිච්ච, චෙතනා සහිතව ව්‍යායාමකොට ; ආපත්තිං, ඇවතට ; ආපජ්ජති, පැමිණේනම් ; සඤ්චිච්ච, චෙතනා සහිතව ව්‍යායාමකොට ; ආපත්තිං, පැමිණි ඇවත ;

පරිගුහති, සිකපදයකෙරේ අනාදරසිතින් වසයි නම් ; සඤ්චිච්ච, චේතනා සහිතව ව්‍යායාමකොට; අගතිගමනඤ්ච, සතර අගතිගමනයටද ; ගච්ඡති, (භාණ්ඩ භාජනාදි ස්ථානයන්හිදී) පැමිණේ නම් ; එදිසො, මෙබඳු ස්වභාවය ඇති පුද්ගලතෙම ; අලජ්ජී පුගගලො, අලජ්ජී පුද්ගලයායයි ; වුච්චති, කියනු ලැබේ—මෙසේ පරිවාරපාළියාගේ පරිඡ්ඡෙදන්ද "එත්ථච සඤ්චිච්චාති ඉමිනා අනාදරියවසෙනෙව ආපත්තිං ආපජ්ජන්තො ආපන්නඤ්චාපත්තිං පරිගුහන්තො භණ්ඩභාජනීයට්ඨානාදිසු අගතිගමනං ගච්ඡන්තොව අලජ්ජීහොති න ඉතරොති දස්සෙති"—එත්ථච, මේ ගාථායෙහිද ; සඤ්චිච්චාති ඉමිනා සඤ්චිච්ච යනමේ වචනයෙන් ; අනාදරියවසෙනෙව, අනාදර චිත්තයෙන්ම ; ආපත්තිං, ඇවතට; ආපජ්ජන්තො, පැමිණෙන්නාවූ; ආපන්නඤ්ච ආපත්තිං, පැමිණි ඇවතද ; පරිගුහන්තො, වසන්නාවූ ; භණ්ඩභාජනීයට්ඨානාදිසු, භාණ්ඩභාජනීයස්ථානාදීන්හී ; අගතිගමනඤ්ච, අගතිගමනයටද ; ගච්ඡන්තො, පැමිණෙන්නාවූ පුද්ගලතෙම ; අලජ්ජීහොති, අලජ්ජියා නම්වේ ; ඉතරො, එයින් අන්‍යවූයේ (හෙවත් අනාදර චිත්තරහිතවූ පුද්ගලතෙම) අලජ්ජීනහොති ඉති, අලජ්ජීයෙක් නොවේයයි ; දස්සෙති, දක්වයි—මෙසේ කඞ්ඛාවිතරණී ටීකාගත පරිඡ්ඡෙදන්ද ආයති සංවරයෙන් තොරව දැනදැන ඇවතට පැමිණීම ශික්ෂාපදයෙහි අනාදර චිත්තයෙන් පැමිණි ඇවත සැඟවීම අගතිගමනය යන තුන අතුරෙන් යම්කිසි අඞ්ගයකින්යුක්ත පුද්ගලතෙම අලජ්ජියා නම්වේ.

මෙතැන්හි නිතර කෙරෙණ ව්‍යතික්‍රමණයෙන් වළකින්ට කල්පනානොකරණ ආයති සංවරයෙන් තොරවූ අභීක්ෂණාපත්තික අලජ්ජියා දෙශනානාමි වුඨානගාමි පිළියම්න් පිළියම් කරනුලැබීනම් ඇවතින් නැගිටීද ? යනු ප්‍රශ්නයයි—අපථ්‍ය

බොජුන් වැළඳීමෙන් රෝගය වර්‍ධනයවූ ගිලනා
,සා දෙනලද ජීවකයාගේ ඖෂධයෙන් ඒ වර්‍ධනය
වූ රෝගය නම් සංසිඳේ—නැවතත් අපථ්‍ය බොජුන්
වළඳනම් රෝගය වර්‍ධනය වෙන්නාක්මෙන්
ගුඩාඥ භෛෂජ්‍යයෙන් පිළියම්කළොත් අවත්ඇව
ගිත් නම් නැගිරී—එහෙත් අලජ්ජීභාවයෙන්
නොමිදී නැවතකරණ ව්‍යතික්‍රමණයෙන්ද ඇවතට
පැමිණේයයි අප ආචාර්‍යභූත මහා ජාගරස්ථවිර
යාණෝ කීහ—උපසම්පදාපෙක්‍ෂකයාසතු පාසිවුරු
නැතිබව නොදන "පරිපුණ්ණස්ස පත්තචීවරං" යි
ගැම්වාක්‍යකීමෙන් වැරදි සිදුනොවන්නාක්මෙන්
"ආයතිංභන්තෙ සංවරිස්සාමි" යන්නෙහි අර්‍ථ අද
හස් නොදන හෝ දැනගත් නමුත් සිහිඑළවන්ට
බැරිව් හෝ කීනමුත් මුසාවාදයක්නම් නොවේ-
"පස්සසි ආවුසො තං ආපත්තිං" යන පශ්චිම
වාක්‍යය වනාහි ආපත්ති ආරොචනයාගේ පරිවාර
වාක්‍ය මාත්‍රයකි—ඇවතින් නැගිසිටීම වනාහි "අහං
භන්තෙ සම්බහුලා නානාවත්ථුකා සබ්බා ආපත්ති
යො ආපජ්ජිං තා තුම්හමූලෙ පටිදෙසෙමි" යන
ආරොචනයෙන්මවන්නේය—වසාබිඥගිධජ මහා
ධම්මරාජාධිරාජගුරුමහාස්ථවිරයෝ "අහංභන්තෙ
සබ්බා ආපත්තියො ආවිකරොමි" යන ආපත්ති
ආවිකරණ වචනයෙන්ම පැමිණි ඇවතින් නැගි
ටින නමුත් සභාග ආපත්ති ආරොචනයෙන්
නැවත පැමිණෙනලද ඇවත්වලින් පිරිසිදුවීම
පිණිසම "අහං භන්තෙ සම්බහුලා…පෙ…පටිදෙ
සෙමි" යන පශ්චිම වාක්‍යය කියනුලබනහෙයින්
දෙවනුව නවකභික්‍ෂුව විසින් ආපත්ති ආරොචන
වාක්‍යය කියා කරණ ආරොචනය වැඩිපුර ආරො
චනයක්යයි කියයි—උන්වහන්සේ එසේ කීවේ
ධීමාමාලකයෙහි පාමොක් අසමින්හුන් භික්‍ෂුවට
පැමිණෙනලද ඇවැත් ඇතිබව සිහිවී "අහං ආවුසො
ඉත්ථන්නාමං ආපත්තිං ආපන්නො ඉතො වුට්ඨහිත්වා

තං ආපත්තිං පටිකරිස්සාමි"යි කියනලද ආවි
කරණමාත්‍රයෙන් ඇවැත් නොනැගිටිනබව ප්‍රකා
ශිත උපොසථක්ඛන්ධක වචනය අමනකවීමෙනැයි
හැගේ—

යථොක්ත විනිශ්චයවූ පරිද්දෙන් සංවාස
යෙහි සැක දුරුවිය. සම්භොග පරිභොගයෙහුත්
වළඳින්ට පුළුවන—ඉදින් බැලිමට පොත්
උවමනාවීම් ආදි කාරණයකින් අලජ්ජීන්ගේ
ආරාම පන්සල්වලට ගොඩවීම් ඇඳ පුටු ආදියෙහි
ඉඳගැනීම් ආදි අකැප පරිභොගයෙන් දුරුවීමවූ
කලී අභියෝගයින් දුෂ්කරයයි කියත් නම් මගයන
භික්ෂුවට මාර්ගයෙහි වී වනනාලදින් යාමට ඉඩක්
නැත් නම් මාර්ගයයි අධිෂ්ඨාන කොට ගෙණ යායුතුයි
කියාද ධාන්‍ය මත්තෙහි අසුන්පණවා ඉදත් නම්
හිඳගන්ට වටීයයි කියාද අට්ඨකථායෙහි විනිශ්චය
කළහෙයින් මෙහිද පරිභොග ශීර්ෂයෙන් කරණ
පරිභොගයක් නොවනනිසා අකැපයක් නැත්තේ
යයි දතයුතුයි—

"තං වත්ථුං විස්සජ්ජෙත්වා ගමනෙන මග්ගෙනාපි
සෙතුනාපි නාවායපි උළුම්පෙනාපි ගන්තුං නවට්ටති
තෙන වත්ථුනා බන්ධාපිතාය පොක්ඛරණියා උබ්භි
තොදකං පාතුං වා පරිභුඤ්ජිතුං වා නවට්ටති
අඤ්ඤතො උදකෙපන අසති අසුඤ්ඤං ආගන්තුකං
උදකංවා වස්සොදකංවා පවිට්ඨං වට්ටති යථාවාසං
ඒතස්ස නවට්ටති එවං අසන්තසම්භාවනායවා කුල
දූසනකම්මෙනවා කුහනාදීහිවා උප්පන්නපච්චයා
නොවිතස්ස න අඤ්ඤස්ස වට්ටන්ති ධම්මෙනසමෙන
උප්පන්නාපි අප්පච්චවෙක්ඛිත්වා පරිභුඤ්ජිතුං න
වට්ටන්ති. චත්තාරොහි පරිභොගා ථෙය්‍ය පරිභො
ගො ඉණපරිභොගො දායජ්ජපරිභොගො සාමිපරි
භොගොති. තත්ථ සංඝමජ්ඣෙපි නිසීදිත්වා පරි
භුඤ්ජන්තස්ස දුස්සීලස්ස පරිභොගො ථෙය්‍ය පරි
භොගො නාම. සීලවතො අප්පච්චවෙක්ඛිත පරි

භොගො ඉණපරිභොගො නාම තස්මා චීවරං පරිභොගෙ පරිභොගෙ පච්චවෙක්ඛිතබ්බං පිණ්ඩපාතො ආලොපෙ ආලොපෙ තථා අසක්කොන්තෙන පුරෙභත්ත පච්ඡාභත්ත පුරිමයාම පච්ඡිමයාමෙසු සචස්ස අපච්චවෙක්ඛිතොව අරුණො උග්ගච්ඡති ඉණපරිභොගට්ඨානෙ තිට්ඨති. සෙනාසනම්පි පරිභොගෙ පරිභොගෙ පච්චවෙක්ඛිතබ්බං. භෙසජ්ජස්ස පටිග්ගහණෙපි පරිභොගෙපි සතිපච්චයතා වට්ටති එවං සන්තෙපි පටිග්ගහණෙ සතිං කත්වා පරිභොගෙ අකරොන්තස්සෙව ආපත්ති. පටිග්ගහණෙ පන සතිං අකත්වා පරිභොගෙ කරොන්තස්ස අනාපත්ති—චතුබ්බිධා හි සුද්ධි දෙසනාසුද්ධි සංවරසුද්ධි පරියෙට්ඨිසුද්ධි පච්චවෙක්ඛණසුද්ධීති සත්තන්නං සෙඛානං පච්චය පරිභොගො දායජ්ජ පරිභොගො නාම ඛීණාසවානං පරිභොගො සාමිපරිභොගො නාම ඉමෙසු පරිභොගෙසු සාමිපරිභොගොච දායජ්ජ පරිභොගොච සබ්බෙසම්පි වට්ටති” (රූපිය සික්ඛාපදවණ්ණනා)—තංවුත්තං, පිළිගැණ්ණ සඟමැද නිසැර්ජිතවූ ඒ ජාතරූපරජතය; විස්සජ්ජෙත්වා, විසර්ජනය කොට ; කත්වා, කරණලද ; මග්ගෙනාපි, මාර්ගයෙන්ද ; සෙතුනාපි, සෙතුයෙන්ද ; නාවායපි, නැවෙන්ද ; උළුම්පෙනාපි, පසුරෙන්ද ; ගන්තුං, යන්ට ; වට්ටති, ඒ ජාතරූපරජතය පිළිගත් භික්ෂුවට නොවටී—“ මග්ගෙන පිති එත්ථ සචෙ අක්ඛණ්ඩමග්ගො නත්ථි මග්ගං අධිට්ඨහිත්වා ගන්තුං වට්ටතීති වදන්ති” (සාරත්ථදීපනී තෙරසකණ්ඩය) තෙනවුත්තා, ඒ මුදලෙන් ; ඛනාපිතාය, සාරවන ලද ; පොක්ඛරණියා, පුෂ්කරණියෙහි ; උබ්භිතොදකං, ඉනු ජලය ; පාතුංවා, පානයකරන්ටද ; පරිභුඤ්ජිතුංවා, ස්නානාදි පරිභොගයටද ; න වට්ටති; නොවටී ; අනෙන උදකෙ, පොකුණේ ඇතුල් ජලය ; අසතිපන, නැතිකල්හි වනාහි ; අඤ්ඤං ආගන්තුකං උදකංවා, අන්‍ය ආගන්තුකව

ආ ජලයද ; පච්ඡංචා, ආකාසපතිතංච ප්‍රවිෂ්ටවූ ;
චමස්සාදකංචා, චණ්ඩාජලයද ; වට්ටති, ඒ කහවණු
පිළිගත් භික්ෂුවට වේ. (කුමකින් වටතේදැයි
කරුණු විචාරත් නම් "ආගන්තුකං" යන හෙතු
මත් විශෙෂණයම "ආගන්තුකතතායි" විසඳතු,
එක්තරා ගැටපදයෙක සඟමැද නිස්සර්ජිතවූ හෙයි
නැයි කරුණු කියා සඟමැද නිසර්ජිතනුවූයේනම්
ආගන්තුක ජලයවූවත් අකැපයයි විනිශ්චය
කළේය—ඒ විනිශ්චය පිළිනොගෙණ කැපපිණ්ඩ
පාතය අකැප නැවිසෙහි දැමූ පමණින් ඒ
කැපනැවියකට මාරුකර වළඳ, නම් අකැපයයි
කියා නැතිවාක්මෙන් විනිශචය දතයුතු—
භික්ෂූහු විසින් පාත්‍රය ගණත් විචාරාගත්කල්හි
පාත්‍ර වෙළෙන්දාගේ අතටපත් කහවණුවලැ කැප
අකැප භාවය කොයිම පෙළඅටුවා ටීකාවකවත්
විමසා විනිශ්චය නොකළේ මිලදී ගනිද්දි භික්ෂුව
විසින් ලත්පසයට අකැප සවභාවය මාරුවූහෙයින්
ඒ කහවණු පරිශුඩභාවයට පැමිණිහෙයිනි—ඉදින්
ඒ පාත්‍ර වෙළෙන්දාගේ ඒ කහවණුවලින් දනොප
කරණ ගෙණ අවුත් දත් දේනම් ඒ කහවණු පිළි
ගත් භික්ෂුවටද කැපවේ—එහෙයින් එය නොකියා
හැරියේයයි දතයුතු—සියලු කයවිකකායන්හි මේ
නය දතයුතු—එහෙයින් වර්තමාන කාලයෙහි බණ
මඩු සංඝික ආරාම අකප්පිය ආරාමාදිය සොරා
හෝ කඩාබිඳ හෝ මිළ දී හෝ ගෙන ධර්මාසන
පුටු බංකු ආදිය තනා විකුණන වෙළඳුන්ගෙන්
මිලදී ගෙණ පරිභොගකිරීම වැරදිනොවේ—සොරා
ගත් තැනැත්තා විසින් විකුටගත් මුදලට අකප්පිය
සංඝික ගරු භාණ්ඩභාවය මාරුවී නතරවූහෙයින්
ඒ සොරාම එයින් අපායභාගී වන්නේයයි කිය
හැක්කේය—දනොපකරණ වශයෙන් දෙනලදින්
සමහර මහණුන් විසින් අකැප අන්දමට පිළි
ගන්නාලදුව ඔවුන්ගෙන් කඩ සාප්පුවලට ගියාවූ

මිළමුදල් බොහෝසේ රට සැමතන්හි විසිර
පවති—ඒ පිරිසිදු පසයක්යයි මෙතෙහිකොට
සැක කුකුස් නුපදවියයුත්තේය) අයසඬා, මේ සඟ
මැද නිසජ්ජිත ජාතරූප රජතයෙන් ඇතිවූ පස
යද ; එතස්ස, තෙලෙ රන්රිදී මසු කහවණු පිළිගත්
මහණහට ; නවටටති යථා, යම්සේ නොවටීද
හෙවත් අකැපවේද ; එවං, එපරිද්දෙන්ම ; අසතත
සම්භාවනායවා, නැති ගුණ හැඟවීමෙන් හෝ
හෙවත් තමන්තුළ නැත්තාවූ උතුරු මිනිස්දම්ඇති
කොට කියා පැසසීමෙන් හෝ; කුලදූසන කමෙම
නවා, මල් ගෙඩි සුණු මැටි හුණ දැහැටිදීම් දූතකම්
වෙදකම් යන අෂ්ටකුලදූෂණයෙන් හෝ ; කුහනා
දීහිවා, කුහනාදියෙන් හෝ ; උප්පනපච්චයා,
උපන්නාවූ ප්‍රත්‍යයෝ ; තස්ස, ඒ නන් සම්පාදක
පුද්ගලයාහට ; නවවටටනනී, නොවටීත්මය;
අසඬස්ස, අනික් සඟදැම්යෙකුටත්; නවටටනති,
නොවටීත්; ධම්මෙන සමෙන, දැහැමින්සෙමින් ;
උප්පනනාපි, උපන්ප්‍රත්‍යයෝද ; අපච්චවෙක්ඛිතවා,
ප්‍රත්‍යවෙක්ෂා නොකොට; පරිභුඤ්ජිතුං, පරිභොග
කරන්ට; නවටටනති, නොවටීත් ; ('හි' යනු
වියනාරාණීදෙශනකයි) පරිභොගා, පරිභොගයෝ ;
ථෙය්‍යපරිභොගො, ථෙය්‍යපරිභොගයද ; ඉණපරි
භොගො, ඉණපරිභොගයද; දායජ්ජ පරිභොගො,
දායජ්ජ පරිභොගයද; සාමි පරිභොගො ඉති, ස්වාමි
පරිභොගයදැයි කියා ; චත්තාරෝ, සතරදෙනෙකි ;
තත්, ඒ සතරදෙනා අතුරෙන් ; සඞ්ඝමජ්ඣෙපි,
සඟමැදවුවත් ; නිසීදිත්වා, හිඳ ; පරිභුඤ්ජනතස්ස,
පරිභොගකරන්නාවූ ; දුස්සීලස්ස, පාරාජිකාවූ මහ
ණහුගේ ; පරිභොගො, පරිභොගය ; ථෙය්‍ය පරි
භොගො නාම, ථෙය්‍ය පරිභොග නම්වේ ; (පාරා
ජිකාවූ මහණම දුශ්ශීලයායයි කියනුලැබේ. පාරා
ජිකානොවූ අලජ්ජීයාවූකලී පිළිපදින පමණට
සිල්වතෙක්වේ) තස්මා, එහෙයින් ; චීවරං, සිවුර ;

පරිභොගෙ පරිභොගෙ, කයින් ඉවත්කර පරිභොග
කිරීමක්පාසා ; පච්චවෙක්ඛිතබ්බං, ප්‍රත්‍යවෙක්‍ෂා
කටයුතුයි ; පිණ්ඩපාතෙ; පිණ්ඩපාතය ; ආලොපෙ
ආලොපෙ, ආලොපයක් ආලොපයක් පාසා හෙවත්
පිඩක් පිඩක් පාසා ; පච්චවෙක්ඛිතබ්බො, ප්‍රත්‍ය
වෙක්‍ෂා කටයුතුයි ; තථාඅසක්කොන්තෙන, එසේ
නොහැකි පුඟුලා විසින් ; පුරෙභත්ත පච්ඡාභත්ත
පුරිමයාම පච්ඡිමයාමෙසු, පෙරබත් පසුබත් පෙර
යැම් පැසිම්යම්හි ; පච්චවෙක්ඛිතබ්බො, ප්‍රත්‍ය
වෙක්‍ෂා කටයුතුයි—මැදුම්යම මහණුන්ගේ හොනා
වේලාව බැවින් නොකියනලදි—විනයාලංකාර
ටීකායෙහි වනාහි මැදුම්යමත් එකතුකොට පස්
වරක්කීහ. එය "එකදිවසෙ චතුක්ඛත්තුං තික්ඛ
ත්තුං ද්වික්ඛත්තුං සකිංමෙවවා පච්චවෙක්ඛිතබ්බං"
යන විශුද්ධිමාර්ගී ටීකාවට සමනොවේ—අස්ස, ඒ
පුද්ගලයා ; අපච්චවෙක්ඛතො, ප්‍රත්‍යවෙක්‍ෂා නො
කරද්දීම ; අරුණො, අරුණ ; සචෙ උග්ගච්ඡති,
ඉදින් නැගේනම් ; ඉණ පරිභොගට්ඨානෙ, ඉණ
පරිභොගස්ථානයෙහිම ; තිට්ඨති, සිටී ; සෙනාස
ණම්පි, සෙනසුනද; පරිභොගෙ පරිභොගෙ, පරිභො
ගයක් පරිභොගයක් පාසාහෙවත් (පරිභොගකරණ
කරණ වාරයෙහි) පච්චවෙක්ඛිතබ්බං, ප්‍රත්‍යවෙක්‍ෂා
කටයුතු—"සෙනාසනම්පි පරිභොගෙ පරිභොගෙති
න පවෙසෙ පවෙසෙ සොභි කාරණන්තරෙන
රුක්ඛමූලස්ස අජ්ඣොකාසිකස්සපි වට්ටති එව
ඨාන නිසජ්ජාදිවසෙන නිවාසාධිප්පායෙසති පරි
භොගෙ පරිභොගෙ පච්චවෙක්ඛිතබ්බං" (වජිරබුද්ධි
ටීකා) භෙසජ්ජස්ස, භෛෂජ්‍යයාගේ ; පටිග්ගහ
ණෙපි, මසකින් දෙමසකින් පෙර පිළිගැනීමෙහිද;
පරිභොගෙපි, පරිභොගයෙහිද ; සතිපච්චයතා,
ගිලානභාව ප්‍රත්‍යවෙක්‍ෂා සිහිය ඇතිබවම ;
වට්ටති, වටනේයි ; එවං සන්තෙපි, මෙසේ දෙක
ලෙක පස්විකුනමුත් ; පටිග්ගහණෙ, පිළිගැන්

ගමනී ; සහිං, පස්චිකුම් සිහිය ; කත්වා, ඇතිකොට ; පරිභොගෙ, පරිභොගයෙහි ; අකරොන්තස්සෙව, පස්චිකුම් නොකරන්නාහටම ; ආපත්ති, සන්නිධි විකාල දුකුලාඇවත්වේ ; පටිග්ගහණෙපන, පිළිගැණීමෙහි වනාහි; සතිං, පස්චිකුම් සිහිය; අකත්වානුපදවා ; පරිභොගෙ, පරිභොගයෙහි ; කරොන්තස්ස, කරන්නාහට ; අනාපත්ති, ඇවැත් නොවේ ; ('හි' යනු දළහීකරණද්‍යොතකයි) සුද්ධි, ශුද්ධිහු ; දෙසනාසුද්ධි, ප්‍රාතිමොක්ෂ සංවරශීල ශුද්ධියද ; සංවරසුද්ධි, ඉන්ද්‍රිය සංවර ශීලශුද්ධියද ; පරියෙට්ඨිසුද්ධි, ආජීව පාරිශුද්ධියද ; පච්චවෙක්ඛණසුද්ධි ඉති, ප්‍රත්‍යසන්නිශ්‍රිත ශීලශුද්ධියදැයි ; චතුබ්බිධා, චතුර්විධවෙත් ; සත්තන්නං සෙක්ඛානං, සප්තවිධ ශෛක්ෂයන්ගේ ; පරිභොගො, පරිභොගයතෙම ; දායජ්ජපරිභොගො නාම, දායජ්ජ පරිභොගය නම්වේ ; ඛීණාසවානං, ක්ෂීණාශ්‍රවයන්ගේ; පරිභොගො, පරිභොගයතෙම ; සාමිපරිභොගො නාම, ස්වාමි පරිභොගය නම්වේ ; ඉමෙසු පරිභොගෙසු, මේ චතුර්විධ පරිභොගයන් අතුරෙන් ; සාමිපරිභොගොච, ස්වාමි පරිභොගයද ; දායජ්ජපරිභොගොච, දායජ්ජපරිභොගයද ; සබ්බසම්පි, සියලු දුශ්ශීල ශීලවන්ත ශෛක්ෂ අශෛක්ෂ යන සතරදෙනාටම; වට්ටති, වටී—මෙහි භාවය නම් දුශ්ශීල පුද්ගලයා සිවුරුහැරද අලජ්ජී උක්ඛිත්තකයෝ ඇවත්වලට පිළියම්කොටද ලජ්ජී පෘථග්ජනයා ප්‍රමාදය දුරුකොටද ශෛක්ෂයාත් සංවෙග විදර්ශනා ඥානයත් නරයේ ඇතිකොටගෙණද විදර්ශනා කර්මස්ථාන භාවනාකෙරෙත් නම් ස්වාමිපරිභොග දායජ්ජපරිභොග භාවයට පැමිණ කැපවූ පරිභොගය කළහැක්කේය යනුයි—මෙසේ අර්ථකථා ටීකාගත හෙයින් දවහල් කාලයක් නම් අකැප පන්සල් සෙවන පරිභොග කෙරෙම්යි යන පරිභොග ශීඝ්‍රයෙන් වෙන්ව මාගීසංඥව උපදවාගෙණ නම් ඒ අකැප පන්සල්

සෙවනෙත්ම යාමද කැපවේ—ඒ එසේමය—පන්සල් සෙවන ඇඳ ඇතිරිලි සෙවනයකරණු කැමති සිත නූපදවා පුද්ගලයා සම්මුඛවීමට හෝ පොත පත නාවකාවලිකව ඉල්ලාගැනීමට හෝ අකැප අලජ්ජීන්ගේ පන්සල්වලට නමුත් ගොඩවීම වැරදි සහිත නොවේ—මේ ප්‍රස්ථාව පිළිසඳර කථා කිරීමට අතිශයින් යොග්‍යයයි මෙතෙනිතොට ඉඳ ගැණීමද වැරදි සහිත නොවේ—පොත්පත් බැලීම් බුදුන් වැඳීම් කමටහන් වැඩීම් ආදිය පරිභොගයක් නොවේ—හුදෙක් පස්කඳසුවය සඳහා පොෂණය කිරීමම පරිභොගයයි කියනුලැබේ—එහෙයින් බැලපත් මුදල අකැප අන්දමෙන් සොයා ලියවා තබනලද අලජ්ජීන්ගේ පොත්පත් වුවත් ගෙණ බැලීම වැරදිනොවේ—මහණුන් විසින් අනාමාස රන්රිදී ඈකැප පරිද්දෙන් සොයා වාත්තුකරවන ලද පෙතිපිළිම ආදියට වැඳුම්පිදුම් කිරීමද අකැප නොවේ—සඟමැද නිසර්ජිත මුදලින් තෙල් ගෙණ පත්තුකරණලද ප්‍රදීපයාගේ ආලෝකය පරිභොග කරණ අදහසින් සැතපීම් එයින් පඨවිකසිණාදි කසිනපරිකර්මකිරීම් පොත් කියවීම් ආදිය මිලමුදල් පිළිගත් භික්ෂුවට පමණක් කැපනොවේ—සඟමැද නිසර්ජිතය නොකරණලද්දේනම් පස්සහදැම්යන්ටම නොවටී—“දීපාලොකෙ නිපජ්ජිතුංපි කසිණපරිකම්මම්පි කාතුං පොත්ථකම්පි වාචේතුං නවට්ටති” දීපාලොකෙ, ප්‍රදීපාලොකයෙහි ; නිපජ්ජිතුංපි, සැතපෙන්ටද ; කසිණපරිකම්මං, පඨවිකසිණාදි කසිණපරිකර්මය ; කාතුංපි, කරන්ටද ; පොත්ථකං, පොත්; වාචෙතුම්පි, කියවන්ටද; නවට්ටති, නොවටී යයි පරිභොගාසාවෙන් කෙරෙණ පරිභොගය සඳහා අර්‍ථකථායෙහි කීහ—(තෙරසකණ්ඩ සාරාර්‍ථදීපනී ටීකායෙහි වනාහි) “කසිණපරිකම්මන්ති ආලොක කසිණපරිකම්මං” යි වර්‍ණනාකලේය—මේ වර්‍ණනාව පරිද්දෙන් අර්‍ථගතහොත් ශික්ෂාපදය අවිතනක

වූහෙයින් බහිධාහි නිෂෙස යොගාවචරයන්ට කප්පියා කප්පිය දෙක නොවිචාරා ත්‍රෛභූමික සංස්කාරයන්හි විදසුන්වැඩීම හෙතුකොටගෙණ ඇවතට පැමිණීමේ කෙලවරක් නැතිබව පෙණේ. එහෙයින් ඒ ටීකා වර්ණනාව විමසියයුත්තීය— "කසිණපරිකම්මන්ති පඨවිකසිණාදි පරිකම්මං"යි කරණලද වර්ණනාවම දීපාලොක පරිභොගය සම්භවන හෙයින් යොග්‍යවේ—මෙසේ කියනලද චතුර්විධ පරිභොගයන් අතුරෙන් "ඉණපරිභොගො නවට්ටති ථෙය්‍ය පරිභොගෙ කථායෙව නත්ථි" ඉණපරිභොගො, ඉණපරිභොගය ; නවට්ටති, නොවටී ; ථෙය්‍ය පරිභොගෙ, ථෙය්‍ය පරිභොගයෙහි ; කථායෙව, කියයුතු බසක්දු ; නත්ථි, නැත — මේ පරිභොගවශයෙන් හා යටකියනලද අලජ්ජී පරිභොග අලජ්ජී ප්‍රග්‍රහ අධම්මිය පරිභොගයන් ගෙන්ද පොෂණයකරණලද ස්කන්ධ ශරීර ඇතියවුනු දුශ්ශීල අලජ්ජී පුද්ගලයන්වී නැසෙතොත් නැසෙත්වා—සැදැහැවත් කුලපුත්‍රයන් විසින් වනාහි සාරගුණයෙන් පිරිහී නිස්සාරභාවයට නොපැමිණීම පිණිස මතු ප්‍රකාශිත පරිදි නිතර මෙනෙහිකොට පාරමී පූණ්‍යසම්භාර සාරයෙන් සාරවත්හු වෙත්වා—

**යංකිඤ්චි බාහිරං වත්ථු යථාකාමං පභිජ්ජතු,**
**අජ්ඣත්තස්මිං ම හිතානමිහි අභිනොනාවෙස**
**පඤ්ඤවා...**
**චක්ඛුභූතා න පුබ්බෙපි භිනා සම්පත්තියො බහූ,**
**පාරමී පුඤ්ඤසම්භාර සාරෙකොව අභිනාකො...**
**තස්මා තමෙව සම්භාරං සබ්බසම්පත්ති සාධකං,**
**සතිමා පඤ්ඤවා රක්ඛ නසොවෙ ඓගසු**
**භෙදනං...**

යංකිඤ්චි බාහිරං වත්ථු, (ගම්බිම් වතුපිටි මිල මුදල් අත්පා කන්නාසා ආදී ජීවිතයපවා නැර)

බාහිරවසතු සියල්ලක් ; යථාකාමං, කැමතිවූ පරිද්
දෙන් ; පගිජ්ජතු, නැසිබිඳීයේවා ; අජ්ඣත්තසම්,
නමයතු ඇතුලත් හරයයි කියයුතු පාරමී කුශලරාශි
ය: අභිහනාමහි, නොනැසී නොබිඳී හතරවුකල්හි ;
එසපඤ්ඤවා, තෙල පැණවත්තෙම ; අභිනොකාප
නොබිඳී නොනැසී සිටියේ නම්වේ ; පුබ්බෙපි,
ඉසුත්කල්හිද ; චක්කිතුනානං, සක්විති ආදි සම්
පත්තියෙන් යුක්තව සිටියාවූ අපගේ ; බහු
සම්පත්තියො, බොහෝ සම්පත්නු ; භිනනා, කැඩී
බිඳී නැසීගියාහුමය ; එකො පාරමී පුඤ්ඤසම්භා
රොච, එකම පාරමී කුශලසම්භාරයම පමණක් ;
අභිජානකො, නිවන් දක්වා ප්‍රකෘතුපනිශ්‍රයෙන්
නොබිඳී නොනැසී පවත්නේවේ ; තස්මා, එසේ
පාරමී පුණ්‍යසම්භාරයම නිවන් දක්වා නොනැසී
පවත්නා සම්පත්හරය වූහෙයින් ; සබ්බසම්පත්ති
සාධකං, දෙව්මිනිස් නිවන් නොහැර සියලුසම්පත්
සිදුකරන්නාවූ ; තමෙවසම්භාරං, ඒ පාරමී පුණ්‍ය
සම්භාරයම ; සතිමා, ස්මෘතිමත්වූ ; පඤ්ඤවා,
පැණැති සැදැහැවත්තෙම ; රක්ඛෙ, නොපිරූ
පෙරැම්පුරා පිරූපෙරැම්වඩා රකින්නේය; ඵෙගගු
හෙදනං, (ගම්බිම් වතුපිටි මිලමුදල් හා අන්ප.
කන්නාසා ආදි ජීවිතයපවා නැර නිඃසාරවූ) බාහිර
වස්තුරාශිය බිඳීගියාට ; නසොචෙ, ශොක නොක
රන්නේය—ඉම් ගාථාඊසි—විමති ටීකා මතය
ඇසුරුකොටගෙණ තමන්ම තමන් ලජ්ජියයි සම්
මතකොටගෙණ ව්‍යාසයකරණ ඇතැම් මහණුන්
විසින් අලජ්ජියයි සම්මත කරණුලැබූ මහණුන්ට
ඔය ඇත්තන් හා අප අතර එකට පිරිත්කීම්
සංඝිකදානගැණීම් ආදියක් නැත යනාදිය ගිහි
පිරිස් මැද කියා ලජ්ජාකරවීම අලජ්ජියයි සම්මත
කරණුලැබූ පුද්ගලයන් විසිනුත් එපරිද්දෙන්ම
කියා බැණවැදීමෙන් සුපෙසල සත්පුරුෂයන්
කෙරෙන් තොරවූ ඇතැම් පලාත්වල යහපත්

සත්පුරුෂයන්ට ඇතුල්වෙන්ට පවා ඉඩ නොතබා යටත්පිරිසෙයින් සතුටු සාමීචි කථාමාත්‍රයකුදු නොකොට භෙදවීමෙන් දෙපක්ෂයම මරණින්මත්තෙහි අපායොත්පත්තියට කරුණුවූ විවාද ඇණුම් බැණුම්වලට හෙතුවූ අකුශල ධර්‍මයන් උත්සන්න කරගැනීමෙන් නෛර්‍යාණික ශාසනය පිරිහීමට මග සැලසෙනහෙයින්

" ධම්මවිනයභාසිතා චිණ්ණපඤ්ඤත්තිකා දුකා
ආපත්ති ලහු දුට්ඨුල්ල සාවසෙස දුකානි ච.
එතා තඨා රසභෙද කරවත්ථූනි වුච්චරෙ
විපල්ලාසගගහිතානි වාදමූලූප නිස්සයා ".

ධම්මවිනයභාසිතා චිණ්ණපඤ්ඤත්තිකාදුකා, ධම්මදුකය විනයදුකය භාසිතදුකය ආචිණ්ණදුකය පඤ්ඤත්තිදුකය යන මොව්හුද ; ආපත්ති ලහු දුට්ඨුල්ල සාවසෙස දුකානිච, ආපත්තිදුකය ලහුදුකය දුට්ඨුල්ලදුකය සාවසෙසදුකය යන මොව්හු දූයි (යන) විපල්ලාසගගහිතානි, විපර්‍යාසවශයෙන් ගන්නාලද්දාවූ ; වාදමූලූපනිස්සයා, සඞ්ඝයා භෙද වීමට හෙතුවූ විවාදමූලයන් ඇතිවීමට බලවත් හෙතුවූ; එතානි අඨාරස, මේ අටළොස්දෙන ; භෙදකරවත්ථූනි, සංඝයා භෙදකොට අවීචි නිරයට හෙළීමට හෙතුවූ ධර්‍මයෝයයි ; වුච්චරෙ, කියනු ලැබෙත්—මෙසේ ආවාවූ " අධම්මං ධම්මොති දීපෙන්ති ධම්මං අධම්මොති දීපෙන්ති" යනාදී සංඝභෙදක වස්තූන් නොකොට නූපදවා සතුරන් අධිකරණෙණ අපායගාමී අකුශල් තුනීකරගණු පිණිස මේ සංවාස දීපනිය ලියා නිමවනලදී—

විසුද්ධාචාරථෙරෙන විසුද්ධාරාමවාසිනා
ලජ්ජීනං යෙව අත්ථාය නිවජ්ජෙයා රචිතොමයා
තං මෙ පසන්නා ධීමන්තා යුත්තං ගණ්හන්තු නෙතරං.

—සංවාස දීපනිය නිමි.—



සබ්බ දානං ධම්ම දානං ජිනාති